# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report

2023

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
நகரக் குடியிருப்பு அபிவிருத்தி அதிகாரசபை
Urban Settlement Development Authority

# වාර්ෂික වාර්තාව

2023

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# අන්තර්ගතය

ආයතනික පාලන වාර්තාව ........................................................................................................2
සභාපති  සමාලෝචනය ........................................................................................................3
අධ්‍යක්ෂ ජනරාල් සමාලෝචනය ........................................................................................................5
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය ........................................................................................................6
2023-12-31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය........................................................................................................7
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරින්ගේ සහභාගීත්වය........................................................................................................12
උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය  සමාලෝචනය ........................................................................................................13
විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය ........................................................................................................14
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය........................................................................................................15
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරි මණ්ඩලය........................................................................................................16
භෞතික සංවර්ධන වැඩසටහන ........................................................................................................18
2023 වර්ෂයේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ........................................................................................................19
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘතින් හි සංවර්ධන කටයුතු හා පවරා ගැනිම........................................................................................................21
ප්‍රජා ව්‍යාපෘති........................................................................................................22
2023 වර්ෂයේ  දී අලෙවිකරණ කටයුතු සිදුකරන ලද නිවාස ව්‍යාපෘති........................................................................................................22
නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට නිවාස හිමිකම් හා ඔප්පු ලබාදීම ........................................................................................................23
නෛතික ක්‍රියාමාර්ග ගැනීම ........................................................................................................24
ඉදිරි භෞතික ව්‍යාපෘතින් හි පරිසරය ආරක්ෂා කර ගැනිමට හා පරිසරය වෙනුවෙන් සෘණාත්මක බලපෑමක් ඇති කරන ක්‍රියාකාරකම් අවම කිරිමට ගෙන ඇති පියවර ........................................................................................................25
අවදානම් තක්සේරු කිරිමේ හා අවම කිරිමේ උපාය මාර්ග........................................................................................................25
සමාජ සංවර්ධන වැඩසටහන........................................................................................................26
සමාජ සංවර්ධන වැඩසටහන 2023 ........................................................................................................27
සමාජ සංවර්ධන වැඩසටහන ජනාවාසයන් තුළ ක්‍රියාත්මක කිරිම ........................................................................................................28
අධ්‍යාපනික වැඩසටහන් සම්බන්ධ ඡායාරූප ........................................................................................................33
2023 ලෝක ජනාවාස දිනය ........................................................................................................39
ලෝක ජනාවාස ජාතික සැමරුම් උත්සවය - 2023 ........................................................................................................42
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර ඉපයීම් (අයකිරීම්) ප්‍රගතිය ........................................................................................................45
භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය ........................................................................................................45
මානව සම්පත් සංවර්ධනය සහ ආයතන පරිපාලන කටයුතු ........................................................................................................46
අධ්‍යාපන ණය ලබාදිම........................................................................................................47
දුක්ගැනවිලි විමසා බැලිම සඳහා වන කමිටුව ස්ථාපිත කිරිම........................................................................................................47
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2023.12.31 දිනට කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර ........................................................................................................48
අවසන් ගිණුම් වාර්තා ........................................................................................................49
විගණකාධිපතිවරයාගේ වාර්තාව ........................................................................................................73

# දැක්ම

**"සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසාර නාගරික ජනාවාස ගොඩනැගීම"**

# මෙහෙවර

**"සුසැදි, සංයුක්ත හා සුරැකි බව රැඳුනු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික, සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම"**

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ

- සැම නාගරික ප්‍රදේශයක් සඳහාම සැලසුම් සහගත සංයුක්ත නාගරික ජනාවාස ඇති කිරීම
- නාගරික ප්‍රජාවන්ගේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය වැඩිදියුණු කිරීම
- නාගරික ප්‍රජාවන් තුළ දේපල හිමිකාරීත්වය පිළිබඳව හැඟීමක් ඇති කිරීම
- අධිකාරියෙහි කාර්ය සාධනය විශිෂ්ටත්වයට පත් කිරීම
- ස්වයං අරමුදල් සහිත ආයතනයක් බවට පත්වීම

# ආයතනික පාලන වාර්තාව



## සභාපති සමාලෝචනය



2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මගින් ස්ථාපිත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින්, නාගරික කලාපයන්හි ජීවත්වන අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නංවාලනු වස්, භෞතික සංවර්ධන ව්‍යාපෘති සහ මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

අප අධිකාරිය ඉදිරි වර්ෂ තුලදී මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි භෞතික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් ආදායම් උත්පාදනය කිරීමට සැලසුම් කරන ලද අතර, එම ක්‍රියාවලිය වඩාත් නිවැරදිව, කාර්යක්ෂමව සහ උපාය මාර්ගික සැලැස්මක් සහිතව ක්‍රියාත්මක කරනු වස් “ව්‍යාපාර සැලැස්මක්” (Business Plan) පිළියෙල කරන ලදි. එහිදී, අධිකාරිය විසින් මධ්‍ය ආදායම්ලාභීන් සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය (PPP) යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 05කි.

එහි දී, වත්තල, “වැලිසර හයිට්ස්” මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගැනීම සහ ඉඩමෙහි පිඹුර සඳහා අනුමැතිය ලබාගැනීම සිදුකරන ලදි. එමෙන්ම, මධ්‍ය ආදායම්ලාභීන් සඳහා වන නිට්ටඹුව, ඕර්වඩ්වත්ත නිවාස ව්‍යාපෘතියෙහි ඉඩම පවරා ගැනීම, ඉඩමේ පිඹුර සඳහා අනුමැතිය ලබා ගැනීම සිදුකරන ලද අතර, ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD) නිර්දේශය සඳහා යොමු කිරීමට හැකියාව ලැබුනි.

මධ්‍ය ආදායම්ලාභීන් සඳහා වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතියට අදාළ ඉඩම පවරා ගැනීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට හැකියාව ලැබුනු අතර, කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීමට යෝජිත ඉඩම හා කඩුවෙල තැපැල් කාර්යාලය ගොඩනැගිල්ල සඳහා වන තක්සේරු වාර්තාව ලබා ගැනීමට ද හැකිවිය. එමෙන්ම, හික්කඩුව, තුඩුවේගොඩ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD) නිර්දේශය සඳහා යොමු කරන ලද අතර, ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

එමෙන්ම, අධිකාරිය විසින් මීට ඉහතදී ක්‍රියාත්මක කරන ලද අඟුලාන “සයුරුපුර” නිවාස ව්‍යාපෘතිය, තලවාකැලේ - ලිඳුල නිවාස ව්‍යාපෘතිය හා අනුරාධපුර “තුරුඉතුරුගම” නිවාස ව්‍යාපෘතීන්හි අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරමින් ප්‍රතිලාභීන්ගේ ගැටළු සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි. හලාවත නරියගොඩැල්ල නාගරික නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය ඉදිකිරීම හා යටිතල පහසුකම් සැලසීම සඳහා වන කටයුතු සිදුකරමින් පවතී. එසේම, සිංහපුර මහල් නිවාස ව්‍යාපෘතියෙහි ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුකර ඇත.

ඒ අනුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද, මොරටුව, ලුනාව “සී වීව් රෙසිඩන්සීස්” මහල් නිවාස ව්‍යාපෘතිය සඳහා අත්‍යාවශ්‍ය ගිනි ආරක්ෂණ සහතිකය, ව්‍යාපෘතියෙහි සංවර්ධන බලපත්‍රය හා අනුකූලතා සහතිකය ලබා ගන්නා ලද අතර, ව්‍යාපෘතියෙහි නිවාස ඒකක 356හිම භුක්තිය ප්‍රතිලාභීන් වෙත බැහැර කිරීමට 2023 වර්ෂයේදී හැකියාව ලැබිනි. එමෙන්ම, 2023 වර්ෂයේ දී

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් රජයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන නිවාස ප්‍රතිලාභීන් වෙත ඔප්පු ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට හැකිවීම සුවිශේෂී අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

නාගරික කලාපයන්හි ජීවත් වන අඩු හා මධ්‍ය ආදායම්ලාභීන් වෙත ඉහත පරිදි භෞතික සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීමට මෙන්ම එම ප්‍රජාවගේ ජීවන තත්ත්වය සමාජ, ආර්ථික හා සංස්කෘතිකමය වශයෙන් ඉහළ නංවාලීමට දීපව්‍යාප්තව සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද අධිකාරිය විසින් සිදුකරනු ලබයි. 2023 වසර තුළදී ප්‍රජා සහභාගීත්ව වැඩසටහන, අධ්‍යාපනික වැඩසටහන, ස්වයංරැකියා ණය වැඩසටහන හා ආගමික, සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන ලෙස ප්‍රධාන වැඩසටහන් 04ක් ඔස්සේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. එහි දී, කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, රත්නපුර, නුවරඑළිය, මාතලේ, අනුරාධපුර, මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි පවතින ජනාවාස 28ක ජීවත් වන අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඉහත පරිදි නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මෙන්ම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි සේවකයන් පිළිබඳවද අවධානය යොමු කරමින් කටයුතු කිරීමටද 2023 වර්ෂයේදී විවිධ ක්‍රියාමාර්ග ගැනීමට හැකි විය.

එහිදී, අධිකාරියේ සේවකයන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සේවයෙහි නියුතු වීමට අභිප්‍රේරණය කිරීමට හැකියාව ලැබී ඇත. මීට අමතරව, අධිකාරියේ සේවකයන් පුහුණු වැඩසටහන් රාශියක් වෙත අවස්ථා කිහිපයකදී යොමු කිරීමට කටයුතු කරන ලදී. ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අධ්‍යාපන ණය පහසුකම් ලබාදීමේ කටයුතු 2023 වර්ෂයේදී ද සිදුකරමින් සේවකයන්ගේ දැනුම වර්ධනය කරමින් මානව සම්පත් කළමනාකරණයට කටයුතු කරන ලදී.

වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ උද්ගත වී පවතින ආර්ථික ගැටළු සහගත තත්ත්වය පිළිබඳව අවබෝධ කරගනිමින්, අධිකාරියේ පනත මගින් පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීමට සියළු අභියෝගයන් හමුවේ නොසැලෙමින්, 2023 වර්ෂයේදී උපරිමයෙන් කටයුතු කළ අතර, ඉදිරියේදී ද නාගරික කලාපයන්හි ජීවත් වන අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් භෞතික සංවර්ධන හා මානව සංවර්ධන වැඩටසටහන් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරමින්, ශ්‍රී ලංකාවෙහි නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වය සමෘද්ධිමත් භාවය කරා ගෙනයාමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හරහා වගකීම් සහගතව උරදෙන බවත් සඳහන් කරමි.

**ප්‍රියන්ත රත්නායක**
**සභාපති**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

## අධ්‍යක්ෂ ජනරාල් සමාලෝචනය



නාගරික ප්‍රදේශයන්හි ජීවත්වන අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය ප්‍රශස්ථ මට්ටමට ගෙන ඒම සඳහා සමාජ, ආර්ථික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත්, අධිකාරිය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි ජීවත් වන ප්‍රජාවගේ සමාජ සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ඇතුළුව පනත ප්‍රකාර නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබයි. එම කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

එහිදී, අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන භෞතික සංවර්ධන වැඩසටහන් සඳහා උචිත ඉඩම් පවරා ගැනීම මගින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වත්කම් සංචිතය ඉහළ නංවමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනිමට හැකියාව ලැබිම සුවිශේෂී වේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි භෞතික සංවර්ධන වැඩසටහන වෙත නව සංකල්පයක් ලෙස, ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සංවර්ධනයට ජීවිතයේ වැඩිම කාලයක් කැපකිරීමක් සිදුකරන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍යයන්හි සේවය කරන ලද මෙන්ම, රටට අභිමානයක් ළඟා කර දුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කෙරෙහි අවධානය යොමු කරන ලදි.

ඒ අනුව, වැඩිහිටි සංකල්පයෙන් ඔබ්බට ගිය සමාජ ආරක්ෂණ වැඩසටහනක් වශයෙනුත්, සැඳෑ සමය ගෞරවාන්විතව, තෘප්තිමත්ව හා හුදකලාබවින් තොරව විවේකිව ගත කිරිම සඳහාත්, එකී ප්‍රජාවට ග්‍රාමීය නගර සංකල්පය යටතේ සමාජ කර්තව්‍යයක් සේ සලකා නිට්ටඹුව ඕර්වඩ්වත්ත ඉඩමෙහි, සියලු පහසුකම් වලින් යුක්තව නිවාස ව්‍යාපෘතියක් සැලසුම් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) නිර්දේශය සඳහා යොමු කරන ලදි.

එසේම, තිරසාර සංවර්ධනයේ සමාජ, ආර්ථික හා පාරිසරික අරමුණු සපුරාලීම සඳහා සීඝ්‍රයෙන් නාගරීකරණය වන ක්‍රියාවලියක් තුළ මානව සම්පත කළමනාකරණය වෙනුවෙන්, සමාජ සංවර්ධන වැඩසටහන් 2023 වර්ෂය තුළදී ද අඛණ්ඩව දීපව්‍යාප්තව සිදුකරන ලදි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි කාර්ය මණ්ඩලය මගින් වඩා ඵලදායී සේවාවක් ලබාගනු වස් ඔවුන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කරමින් කුසලතා ප්‍රවර්ධනය කිරිම උදෙසා සේවක අභිප්‍රේරණය වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබිණි. එමෙන්ම, අධිකාරියෙහි සේවක ඉල්ලීම් හා දුක්ගැනවිලි පිළිබඳ සලකා බලා විශ්ලේෂණය කොට, නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමේ අරමුණින්, "සේවක ගැටළු කළමනාකරණය පිළිබඳ කමිටුවක්" (Committee of Grievances Handling) ස්ථාපිත කොට, සේවක ගැටළු සඳහා විසඳුම් ලබා දීමට පියවර ගන්නා ලදි. එමෙන්ම අධිකාරිය ස්වයං උත්පාදිත අධිකාරියක් බවට පත් කිරීමේ අරමුණින් ,ඒ සඳහා වූ උපාය මාර්ගික සැලැස්මක් සහ ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළෙමු.

ඒ අනුව, 2008 අංක 36 දරන පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරි ඇති බලතල ඔස්සේ, ශ්‍රී ලංකාවේ නාගරික අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, සියළු බාධක ජය ගනිමින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණු ඉටුකර ගැනිමෙහිලා 2023 වර්ෂය තුළදි ද කටයුතු කිරීමට හැකියාව ලැබුනු බව සඳහන් කරමි.

**විජයානන්ද හේරත්**
**අධ්‍යක්ෂ ජනරාල්**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

## අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය

නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ නිවාස ගැටළු සඳහා විසඳුම් ලබා දීම හා ඔවුන්ව සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වේ. ඒ සඳහා භෞතික හා සමාජ සංවර්ධනය යන දෙවැදෑරුම් ප්‍රවේශයන් යටතේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන සියලුම ගණුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර, ගිණුම් පොත් පවත්වාගෙන යාම, සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරිය වෙත පැවරී ඇත. ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල දී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමටත්, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලා ඇත. අධිකාරිය සතු වත්කම් ආරක්ෂ කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ එහි වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනියත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනිමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපතිත්වය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් දරණු ලබයි.

# 2023-12-31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය



**හේරත් ආරච්චිලාගේ නිමේෂ් දිල්ෂාන් හේරත් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර හොබවන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ තොරතුරු තාක්ෂණය පිළිබඳව විද්‍යාවේදී ගෞරව උපාධිය ( SLIIT)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධිය ලබාඇත.

සංචාරක ක්ෂේත්‍රයෙහි අලෙවිකරණය, ව්‍යාපාර සංවර්ධනය, විකුණුම් සහ අලෙවි කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳව වසර 08කට ආසන්න කාලයක පළපුරුද්ද සමඟ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වසර 15කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇත.

තවද,

සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය

අධ්‍යක්ෂ, කලම්බු ලැන්ඩ් ඇන්ඩ් ඩිවලප්මන්ට් සමාගම

අධ්‍යක්ෂ , ලංකා රෙස්ට් හවුස් සමාගම

සභාපති, නාගරික ආයෝජන සහ සංවර්ධන පුද්ගලික සමාගම

අධ්‍යක්ෂ, ඔනාලි හෝල්ඩින්ස් සමාගම

අධ්‍යක්ෂ , තේ, රබර් හා පොල් වතු , කැබලි කිරිමෙ පාලන මණ්ඩලය
යන ආයතන වල නිලතල හොබවනු ලබයි.



**රජීව් සූරියාරච්චි මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර හොබවන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික , නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, නාගරික සංවර්ධන අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික , හෝටල් සංවර්ධකයින්ගේ (ලංකා) සමාගම

අධ්‍යක්ෂ , තේ, රබර් හා පොල් වතු, කැබලි කිරිමේ පාලන මණ්ඩලය

උප සභාපති, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම (2019 සිට 2022)

උප සභාපති- Cooplife Insurance Company
අධ්‍යක්ෂ , මාර්ග සංවර්ධන අධිකාරිය

සම්බන්ධීකරණ ලේකම් නියෝජ්‍ය අමාත්‍ය (ආපදා කළමනාකරණ)

සම්බන්ධීකරණ ලේකම් නියෝජ්‍ය අමාත්‍ය (වාරිමාර්ග හා ජල කළමනාකරණ 2010 – 2015

සම්බන්ධීකරණ ලේකම්, අමාත්‍ය (අධිවේගී හා මාර්ග සංවර්ධන) 2006 - 2010



**බොතලේ අප්පුහාමිලාගේ රුක්මල් චාමින්ද පියරත්න මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ සේවය කරනු ලබයි මේ වන විට ,

කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශිය සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2015

කැළණි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ (මානව සම්පත් කළමනාකරණය) විශේෂ පිළිබඳ උපාධිය දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය

මිලෝඩා මුල්‍ය අධ්‍යයන ආයතනයේ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම් පිළිබඳ ඩිප්ලෝමාව 2018

-ICTAD ආයතනයේ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2009

DIPPCA-SLIDA ආයතනයේ රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව- 2008

රජයේ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ වසර 08ක වෘත්තිමය පළපුරුද්ද - (2005-2012)

ප්‍රාදේශීය සැලසුම් පිළිබඳ වසර 05 පළපුරුද්ද (2012-2017)

ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණ පිළිබඳ වසර 4ක පළපුරුද්ද (2017 - මේ දක්වා)ලබයි.



**ඒකනායක වලව්වේ නලින් සමරකෝන් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සේවය කරනු ලබන අතර මේ වන විට,

Senior Attorney -at-Law as an Apprentice as AJS Associate & Legal Consultants. - 2012

Junior partner at at-Law as an Apprentice as AJS Associate & Legal Consultant 2013-2015

Partner at AJS Associate & Legal Consultant - 2015-2019

Independent Counsel & Legal Consultant - 2013 to date.

Partner at Samarakoon & Ranasinghe Associates from 2019 to date.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් 2012 වර්ෂයේ දී දිවුරුම්දීම

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිඥ අවසන් වසර පරීක්ෂණය 2011 වර්ෂයේ දී සාර්ථකව අවසන් කිරිම

2011 වර්ෂයේ දී නීතිවේදී උපාධිය ලබාගැනිම (විවෘත විශ්වවිද්‍යාලය)

ඉංග්‍රීසි ඩිප්ලෝමාව (NIBM) 2013

කම්කරු කළමණාකරන පිළිබඳ පාශ්වාත් උපාධිය ලබාගැනිම (කැලණිය විශ්වවිද්‍යාලය)



**කුලප්පු තන්තිරි කෝරාළලාගේ ප්‍රසන්න අරම්පත් මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සේවය කරනු ලබන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

නීතිවේදී උපාධිය (විවෘත විශ්වවිද්‍යාලය) 2011

ඉංග්‍රීසි ඩිප්ලෝමාව (NIBM) 2013

කම්කරු කළමනාකරණ පශ්චාත් උපාධිය (කැලණිය විශ්වවිද්‍යාලය)

නාගරික සංවර්ධන අධිකාරි - අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

රක්නා ලංකා ආරක්ෂ සමාගම - කවුන්සිලයේ සාමාජික

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**මානව හිමිකම් ක්‍රියාකාරිකයෙකු ලෙස 1992 සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කර ඇත.**

1992 සිට 2015 කාලය තුල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් විමර්ශනය.

• 1992 සිට 1996 දක්වා මානව හිමිකම් කාර්ය සාධක බලකායේ (HRTF) වසර 4 ක පළපුරුද්ද, (කනිෂ්ඨ විමර්ශන නිලධාරියෙකු ලෙස)

නිලධාරියෙකු ලෙස සේවයට බැදී ජෙයෂ්ඨ විමර්ශන නිලධාරියෙකු ලෙස උසස් වීම් ලබා ඇත.

**(පරිපාලනය සහ මුල්‍ය අධ්‍යක්ෂ)**

• 2013.06.12 දින සිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වැඩ බලන අධ්‍යක්ෂ පරිපාලක සහ මුල්‍ය නිලධාරියෙකු ලෙස උසස් විම් ලබා ඇත.



**ජී.සී.ජේ.යු.ප්‍රනාන්දු මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

වාණිජ පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (1989 – 1992)

මාධ්‍ය නිදහස හා ප්‍රකාශනය පිළිබඳව ( **International Academy for Leadership, Germany** )

දේශපාන උපායමාර්ග සම්බන්ධයෙන් (**Council of Asia Liberals & Democrats, Indonesia)**

තරුණ සේවා නිලධාරි - යෞවන සංවර්ධන හා රැකියා අමාත්‍යාංශය 1990 – 1994

අභ්‍යාසලාභී ගුරු - අධ්‍යාපන අමාත්‍යාංශය 1994 – 2006

නිදහස් - මාධ්‍යවේදි - ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය 1994 – 2006

කළමනාකරු මානව සම්පත් සහ සමාජ අනුකූලතා - Global Transportation and Logistics Pvt Ltd Seeduwa 2006 -2012 )

ප්‍රධාන විධායක නිලධාරි - Lanka Television Network (Pvt) Ltd. (VFM Radio) 2012 – 2018)

අධ්‍යක්ෂ ප්‍රවර්ධන - SMR Engineering (Pvt) Ltd 2004 මේ දක්වා )

සම්බන්ධීකරණ ලේකම් - පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ 2020 සිට මේ දක්වා



**ඩී.එස්.ජේ. හේවාවිතාරණ මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ / සිවිල් ඉංජිනේරු
SMR Engineering (Pvt.) Limited 2004 මාර්තු - වර්තමාන කොළඹ.

අධ්‍යක්ෂ මෙහෙයුම්,ඉසුරු ඉංජිනේරු පුද්ගලික සමාගම, 1993-2003

ව්‍යාපෘති කළමනාකරු, උපදේශන ඉංජිනේරු සහ කොන්ත්‍රාත් පුද්ගලික සමාගම ,1991-1992

වැඩබිම් ඉංජිනේරු, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, 1986-1991

වැඩ ඉංජිනේරු, නිවාස සංවර්ධන අධිකාරිය, 1985-1986

ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලයේ සභාපති

ජාතික ඔලිම්පික කමිටුවේ විධායක කමිටු සාමාජික

එස්එම්ආර් ඉංජිනේරු පුද්ගලික සමාගමේ සභාපති

අධ්‍යක්ෂ (මෙහෙයුම්) ඉසුර ඉංජිනේරු පුද්ගලික සමාගම , කොළඹ 07 ,1993 – 2003

මෙහෙයුම් කළමනාකරු , K.M.C. 1984 - 1985



**ප්‍රදීප් වීරසේකර මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

සබරගමුව විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යයනය) උපාධිය.- 1997

කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති (සේවා කළමනාකරණය)පශ්චාත් උපාධිය - 2016

පෞද්ගලික ලේකම්, ගරු නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ -2020

පෞද්ගලික ලේකම්, ගරු අපනයන සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන ,සංචාරක සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ - 2020.

ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2020.

පෞද්ගලික ලේකම්,බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ.

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023

සම්බන්ධීකරණ ලේකම් , ගරු වරාය සංවර්ධන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය , රෙජී රණතුංග මැතිතුමාගේ - 2001

කොළඹ මහ නගර සභාවේ සුභසාධක නිලධාරී 2009 - 2024



**කහටපිට කංකානමලාගේ සුජීව සම්පත්**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) ජීව විද්‍යා අංශය

කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමාව

ජාතික තරුණ සේවා සභාවේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ සමස්ථ ලංකා ප්‍රධාන ලේකම්වරයා ලෙස කටයුතු කිරිම

ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරිම

මීනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව රාජ්‍ය නිලධාරියෙකු ලෙස වසර 10ක සේවය

මීනුවන්ගොඩ ප්‍රාදේශිය සභාවේ උප සභාපතිවරයා ලෙස 2011 වසරේ සිට දෙවතාවක් කටයුතු කිරිම

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් හා සම්බන්ධීකරණ ලේකම් ලෙස වසර 10ක සේවා කාලය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරිම

සංචාරක අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරිම

කාර්මීක අපනයන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරිම.

දකුණු ආසියානු කලාපීය තරුණ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කිරිම.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරින්ගේ සහභාගීත්වය

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම | රැස්වීම් අංකය හා පවත්වන ලද දිනය | | | | | | | | | | පැමිණීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023.01.10 | 2023.02.21 | 2023.03.22 | 2023.04.28 | 2023.05.31 | 2023.06.28 | 2023.07.27 | 2023.09.27 | 2023.10.31 | 2023.11.30 | |
| | 01/ 2023 | 02/ 2023 | 03/ 2023 | 04/ 2023 | 05/ 2023 | 06/ 2023 | 07/ 2023 | 08/ 2023 | 09/ 2023 | 10/ 2023 | |
| ආර්.එම්.එස්.පී.කේ. රත්නායක මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| එච්.ඒ.එ හේරත් මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| රජීව් සූරියආරච්චි මහතා | - | √ | √ | √ | - | √ | √ | √ | √ | √ | 10/08 |
| බී.ඒ.ආර්.සී.පියරත්න මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| ඊ.එම්.එන්. එදිරිසිංහ මහත්මිය | √ | √ | √ | √ | | | | | | | 10/04 |
| ඊ.ඩබ්.නලීන් සමරකෝන් මහතා | √ | - | √ | √ | √ | √ | √ | √ | | - | 10/08 |
| කේ.ටී.කේ.පී.අරම්පත් මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| ජී.සී.ඒ.යු.ප්‍රනාන්දු මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| ඩී.එස්.ජේ.හේවාවිතාරණ මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| ප්‍රදීප් විජේරත්නසේකර මහතා | | | | | | | | √ | √ | √ | 10/03 |
| කේ.කේ.සුජීව සම්පත් මහතා | | | | | | | | √ | √ | √ | 10/03 |

## උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය සමාලෝචනය

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතින් 10 වන වගන්තිය ප්‍රකාරව උපදේශක කමිටුව පිහිටුවනු ලැබීය. ඒ අනුව පහත සඳහන් කාර්යයන් උපදේශක මඟින් ඉටුකළ යුතුවේ. එනම්,

අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩසටහන් වලට අදාළ යම් කාරණාවක් අනුමත කිරීමේදී සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමේදී උපදෙස් ලබාදීම.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදේශක කමිටුවේ කා ර්යභාරය සම්බන්ධයෙන් අනුමත කරන ලද රීති හා කර්තව්‍යයන් ඉටුකිරිම.

ප්‍රමාණවත් ස්ත්‍රී පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික වෙමින් උපදේශක කමිටුව සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයින් 14 දෙනෙකුට වැඩි නොවන පිරිසකගෙන් උපදේශක මණ්ඩලය සමන්විත විය යුතු බව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ සඳහන් වි ඇත.

ඒ අනුව 2023-12-31 දිනට අධිකාරියේ උපදේශක කමිටු සංයුතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| නීතිඥ කේ.ටී.කේ.ප්‍රසන්න අරම්පත් මයා | - කමිටු සභාපති |
| වරලත් ඉංජිනේරු ඩී.ටී.රාජසේකරන් මයා | - කමිටු සාමාජික |
| වරලත් වාස්තුවිද්‍යා බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය | - කමිටු සාමාජික |
| චන්දිම පතිරණ මයා | - කමිටු සාමාජික |
| තරංග නලීන් ගම්ලත් මයා | - කමිටු සාමාජික |
| ශානිකා ගොපල්ලව මෙය | - කමිටු සාමාජික |
| සුජානි බෝගොල්ලාගම මිය | - කමිටු සාමාජික |



**කමිටු සභාපති**
**නීතිඥ**
**කේ.ටී.කේ.ප්‍රසන්න අරම්පත්**



**කමිටු සාමාජික**
**වරලත් ඉංජිනේරු**
**ඩී.ටී.රාජසේකරන් මයා**



**කමිටු සාමාජික**
**වරලත් වාස්තුවිද්‍යා**
**බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය**



**කමිටු සාමාජික**
**චන්දිම පතිරණ මයා**



**කමිටු සාමාජික**
**ශානිකා ගොපල්ලව මෙය**



**කමිටු සාමාජික**
**සුජානි බෝගොල්ලාගම මිය**

## විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරින්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දිමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, නියෝජ්‍ය අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ, බී.ඒ.ආර්.සී. පියරත්න මහතා කමිටු සභාපති ලෙස කටයුතු කළ අතර අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන නීතිඥ නලින් සමරකෝන් මහතා සහ ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

ජාතික විගණන කාර්යාලයේ, රජයේ විගණන අධිකාරි සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගි වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හීදී අනෙකුත් නිලධාරින් රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2023 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 04 ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතින් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදි.
සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

සාමාජිකයින්, නිරීක්ෂකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,



**කමිටු සභාපති**
**බී.ඒ.ආර්.සී. පියරත්න මහතා**



**කමිටු සාමාජික**
**නීතිඥ නලින් සමරකෝන්**



**කමිටු සාමාජික**
**ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා**

**අධ්‍යක්ෂ ජනරාල්, විගණන හා කළමනාකරණ කමිටු ලේකම්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය



## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරි මණ්ඩලය



ප්‍රියන්ත රත්නායක මහතා
සභාපති



විජයානන්ද හේරත් මහතා
අධ්‍යක්ෂ ජනරාල්



කේ.කේ.ඩබ්.තුෂාරි පී.ද සිල්වා මිය
අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප)



ඒ.ජී.එස්.එන්. නිශාන්ති මිය
අධ්‍යක්ෂ (මුදල්)
2017.10.02 සිට 2023.11.30



පී. එම්.ඒ. වීරක්කොඩි මිය
අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ)



එස්.සුරංග මුණසිංහ මහතා
අධ්‍යක්ෂ (ඉංජිනේරු)



ඒ.එම්.කේ.බී. අතාවුද මහතා
වැ.බ. අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
2023.11.30 සිට



ඩී.ඒ. දේවිකා දිසානායක මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)
2011.11.01සිට 2023.10.28
දක්වා



ඒ.පී.ආර්. ඥානප්‍රිය මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)



එල්.ආර්.ඒ. ශාන්ත මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(අභ්‍යන්තර විගණක)



ආර්.ඩී. සුසන්ත ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ප්‍රසම්පාදන හා අලෙවිකරණ)



අනුෂා රාජපක්ෂ මෙය
සහකාර අධ්‍යක්ෂ
(වාස්තු විද්‍යා)



ආර්.ඒ.සුසන්ත මහතා
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



එම්. පුෂ්පා මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



කේ.අයි. දර්ශනී මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



ඒ.එල්. හර්ෂ දිලංකර මහතා
සහකාර අධ්‍යක්ෂ
(ඉඩම් හා වත්කම් කළමනාකරණ)



ජයාත්‍රි ආරියතිලක මිය
සහකාර අධ්‍යක්ෂ
(පර්යේෂණ හා සංවර්ධන)



ශලනී අගලවත්ත මිය
සහකාර අධ්‍යක්ෂ (නීති)
2023.12.22 දින සිට

# භෞතික සංවර්ධන වැඩසටහන



## භෞතික සංවර්ධන වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි 2023 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මධ්‍ය ආදායම්ලාභී හා අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති සම්බන්ධව හා එම ව්‍යාපෘති සඳහා අත්කරගත් භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි සටහන් කල හැකිය. එමෙන්ම, 2021 වර්ෂයෙහි ජනතා අයිතියට පත්කරන ලද ලුනාව "සී වීව්" නිවාස ව්‍යාපෘතියෙහි නිවාස ඒකක මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙත අලෙවිකිරිමේ කටයුතුද 2023 වර්ෂයේදී සිදුවිය.

## 2023 වර්ෂයේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති

### වැලිසර මිල්ලගහවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 179 ඇලපිටවල ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 2.4532 ක්වු භූමි ප්‍රමාණයක මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙම ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාරව නිදහස් දීමනාවක් ලෙස නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

මේ සඳහා වු නව ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සිදුකර ඇති අතර ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරිම සඳහා වු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.

තවද මෙම ව්‍යාපෘතිය සඳහා වු මූලික සැලසුම් නිරාකරණ සහතිකයේ පරිදි මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ අනුමැතිය ලබාගැනිම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නේවාසික ව්‍යාපෘතියක් සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකය ලබා ගැනිම සිදුකර කර ඇත . එමෙන්ම මෙම ඉඩමට අදාළව සකස් කර ඇති අංක 11268 දරණ පිඹුර, වත්තල ප්‍රාදේශීය සභාව මඟින් අනුමත කර ඇත.

### නිට්ටඹුව ඔර්වර්ඩ්වත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නබදලුව ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 3.6932ක භූමි ප්‍රමාණයක මෙම ව්‍යාපෘතිය ඉදිකිරිමට සැලසුම් කර ඇත. මෙම ඉඩම අංක 2296/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර ඉඩමට අදාළව සකස් කර ඇති අංක 1544 දරණ පිඹුර අත්තනගල්ල ප්‍රාදේශීය සභාව මඟින් අනුමත කර ඇත.

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, 521 A, ඇතුල්කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 0.2795ක භූමි ප්‍රමාණයක මෙම ව්‍යාපෘතිය ඉදිකිරිමට සැලසුම් කර ඇත. රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාරව නිදහස් දීමනාවක් ලෙස මෙම ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත. තවද , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම සඳහා වන තක්සේරු වාර්තාව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන ඇත.

### හික්කඩුව, තුඩුවේගොඩ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය

නාගරික කලාපයන්හි ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලනු වස් භෞතික සංවර්ධන ව්‍යාපෘති සිදුකිරිම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කොට, තුඩුවේගොඩ නාගරික නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. එහෙත්, BD/CBP/01/04-2022 දරණ රාජ්‍ය වියදම් පාලනය පිළිබඳ ජාතික අයවැය චක්‍රල්බය ප්‍රකාරව භෞතික සංවර්ධන ව්‍යාපෘතීන්හි ඉදිකිරිම් කටයුතු අත්හිටුවිමට සිදුවිය. එකී හේතුව මත මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ සිදුකිරීම සඳහා නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදි.

එම ව්‍යාපෘති යෝජනාව අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. මෙම ව්‍යාපෘතියට අදාල ඉඩම, 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පවරා ගැනිමේ කටයුතු සිදුකරමින් පවති.

### අතුරුගිරිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, 487 ඒ ශාන්තාලෝකගම ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර් 0.4046ක භූමි ප්‍රමාණයක මෙම ව්‍යාපෘතිය ඉදිකිරිමට සැලසුම් කර ඇත. මෙම 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඉඩම වෙත පවරාගැනිමේ කටයුතු සිදුකරමින් පවතී.

### කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

කඩුවෙල තැපැල් කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම සඳහා වන තක්සේරු වාර්තාව කඩුවෙල ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය - මාළඹේ වෙතින් ලබාගෙන ඇති අතර, ඉඩම සඳහා වන අංක CO/KDW/2022/482 දරණ සමෝච්ඡ රේඛා අනුරේඛනය ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගැනීමේ කටයුතු සිදුකර ඇත. එමෙන්ම, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.2757ක විශාල තත්ත්වයෙන් යුතු මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් 2023 වසරෙහි මධ්‍ය අදායම්ලාභී නාගරික ප්‍රජාව වෙනුවෙන් පෞද්ගලික සහභාගීත්ව ක්‍රමවේදය යටතේ සිදුකිරිම සඳහා සැලසුම් කර තිබූ උක්ත නිවාස ව්‍යාපෘතීන්ට අදාලව මුලික අනුමැතීන් ලබාගැනීමේ කටයුතු, ඉඩම් පවරාගැනිමේ කටයුතු සහ ව්‍යාපෘති ඉදිකිරිම් කටයුතු ආරම්භ කිරිමට අදාල මුලික කටයුතු සිදුකරන ලදි. මෙම වසර තුල පැවති ආර්ථික අර්බුධය හමුවේ රට තුල සියලුම ඉදිකිරිම් කටයුතු අඩපන වූ අතර ව්‍යාපෘති සඳහාද ව්‍යාපෘති සංවර්ධකයකු හෝ ආයෝජකයෙකු සොයාගැනිම අසිරු විය. 2023-12-31 දිනට මෙම ව්‍යාපෘති සඳහා අත්කරගත් ප්‍රගතිය ඉහත පරිදි වේ.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘතින් හි සංවර්ධන කටයුතු හා පවරා ගැනීම

### අඟුලාන, සයුරුපුර නිවාස ව්‍යාපෘතිය

මොරටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, අඟුලාන උතුර ග්‍රාම නිලධාරි වසමෙහි පිහිටා ඇති පයුරුගහවත්ත, දොඹගහවත්ත/ වැටකෙයියාගහවත්ත ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇත. මෙම වසරේදි මෙම ව්‍යාපෘතිය සඳහා ආරක්ෂිත ගේට්ටුවක් සහ Chain Link වැට සකස් කිරීම, නිවාස 09ක අපජලය බැසයන පද්ධතිය අළුත්වැඩියා කිරිම හා හඳුනාගත් නිවාස අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සිදුකරන ලදි.

### අනුරාධපුර, තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, තුලාන 302 කටුකැලියාව ග්‍රාම නිලධාරි වසමේ පරසන්ගස්වැව මූකලාන නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභින් වෙත බැහැර කර ඇත. රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාර නිදහස් දීමනා ලෙස පවරා ගෙන ඇති අතර, ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 7.7586 වේ. මෙම වසරේදී ව්‍යාපෘතියේ එක් නිවසක අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.

### තලවකැලේ, ලිඳුල නිවාස ව්‍යාපෘතිය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, හොලිරූඩ් ස්ටේට් නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර, ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇත. මෙම වසරේදී මෙම ව්‍යාපෘතියෙහි මාගර්ය හරහා ස්ථාන තුනකින් කොන්ක්‍රීට් කාණු යොදා 20mm කම්බියෙන් ආවරණ දැල යෙදිම හා නිවාස අංක 17, 23 හා 38 යන නිවාස ඒකක අළුත්වැඩියා කර නිවාසලාභින් හට ලබාදීම සිදුකර ඇත.

### හලාවත, නරියාගොඩැල්ල නිවාස ව්‍යාපෘතිය

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, 568 මුන්නේශ්වරම ග්‍රාම නිලධාරි වසමේ මීකුලම හෝ නරියගොඩැල්ල නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇත. ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.308ක විශාල තත්ත්වයෙන් යුතු මෙම ඉඩම, නාගරික ජනාවාස සංවධර්න අධිකාරිය වෙත පවරා ගෙන ඇත. මෙම වසරේදී නිවාස ව්‍යාපෘතියේ නිවසක් පිළිසකර කිරීම් වලට අදාළව සිදුකළ යුතු වැඩ කොටස් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

තවද මෙම ව්‍යාපෘතියේ කාණු පද්ධතිය ඉදිකිරිම හා යටිතල පහසුකම් සැලසීම සඳහා අධිකාරියේ අභ්‍යන්තර ප්‍රතිපාදන තුළින් රු. මිලියන 2.86ක මුදල හලාවත ප්‍රාදේශිය සභාව වෙත ලබා දීම සඳහා නාගරික සංවධර්න හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත.

### සිංහපුර මහල් නිවාස ව්‍යාපාතිය

තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ 48 වත්ත නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇත. මෙම ඉඩම රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්ති ප්‍රකාර නිදහස් දීමනා ලෙස මෙම වසරේදී පවරා ගෙන ඇති අතර, ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.4423 වේ.

## ප්‍රජා ව්‍යාපෘති

මට්ටක්කුලිය ශ්‍රී වික්‍රමපුර ප්‍රජාශාලාවේ ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදි හඳුනාගත් අළුත්වැඩියා කටයුතු සිදු කිරිම

## 2023 වර්ෂයේ දී අලෙවිකරණ කටයුතු සිදුකරන ලද නිවාස ව්‍යාපෘති

**ලුනාව "සී වීව් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය**

කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව නාගරික බල ප්‍රදේශය තුල පවතින තානායම්වත්ත නැමති ඉඩමෙහි, නිවාස ඒකක 356 කින් සමන්විත "ලුනාව නාගරික නිවාස ව්‍යාපෘතිය" 2012 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙම නිවාස ව්‍යාපෘතිය 2021 වර්ෂයේ අප්‍රේල් මස 09 වන දින ජනතා අයිතියට පත් කරන ලදි. වර්ග අඩි 410කින් සමන්විත නිවාස ඒකකයක් නිදන කාමර 02ක්, විසිත්ත කාමරයක්, කුඩා ප්‍රමාණයේ පැන්ට්‍රියක් සමඟ එළිමහන් සඳළුතලයකින් සමන්විත වන අතර, විදුලි සෝපාන, ප්‍රජා ශාලා, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, අභ්‍යන්තර මාර්ග සහිත රථ ගාල් වැනි අත්‍යාවශ්‍ය අංගෝපාංගයන්ගෙන් යුක්තව නිවාස සංකීර්ණය ඉදිකරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදුකළ අතර ව්‍යාපෘති කළමණාකරණය රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් සිදු කරන ලදි. නිවාස ඒකක 356 මේ වන විට ප්‍රතිලාභින් වෙත භුක්තියට බැහැර කර ඇත. මෙම වසරේදි ව්‍යාපෘතිය සඳහා ගිනි ආරක්ෂණ ප්‍රමාණවත් බව පිළිබඳ සහතිකය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරියා විසින් ලබා දෙන ලදී. නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධන බලපත්‍රය හා අනුකූලතා සහතිකය මෙම වසරේ දී ලබාගන්නා ලදි.






## නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට නිවාස හිමිකම් හා ඔප්පු ලබාදීම

2023 වර්ෂයේ දී අධිකාරිය ප්‍රතිලාභීන් සමඟ වාරික සින්න ගිවිසුම, විකිණීමට එකඟවීමේ ගිවිසුම් හා අතිරේක වාරික සින්න ගිවිසුම් පත්‍ර අත්සන් කිරීම සිදුකරන ලදි.

### නිවාස වලට අදාල ඔප්පු ලබාදීමේ කටයුතු

| # | නිවාස ව්‍යාපෘතිය | නිවාස සංඛ්‍යාව | 2022.12.31 ඔප්පු ලබාදීමේ ප්‍රගතිය | 2023 වර්ෂයේ දී ලබාදී ඇති ඔප්පු | ලබාදීමට ඇති ඔප්පු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | සහස්පුර මහල් නිවාස ව්‍යාපෘතිය | 686 | 564 | 23 | 99 |
| | අනුරාධපුර -තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතිය | 102 | - | 01 | 101 |
| | වදුලුසෙවණ මහල් නිවාස ව්‍යාපෘතිය | 50 | - | - | 50 |
| | සිංහපුර නිවාස ව්‍යාපෘතිය -I වන අදියර | 60 | - | - | 60 |
| | සිංහපුර නිවාස ව්‍යාපෘතිය -II වන අදියර | 60 | - | - | 60 |
| | අඟුලාන "සයුරපුර" මහල් නිවාස ව්‍යාපෘතිය | 288 | - | - | 288 |
| | හලාවත නරියගොඩැල්ල නාගරික නිවාස ව්‍යාපෘතිය | 57 | - | - | 57 |
| | තලවාකැලේ නාගරික නිවාස ව්‍යාපෘතිය | 54 | - | - | 54 |
| **එකතුව** | | **1,357** | **546** | **24** | **769** |

### නිවාස වලට අදාල ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු

| # | නිවාස ව්‍යාපෘතිය | 2023 වර්ෂයේ ගිවිසුම් අත්සන් කළ ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| | බොරැල්ල "සහස්පුර" මහල් නිවාස ව්‍යාපෘතිය | 06 |
| | අනුරාධපුරය "තුරුඉතුරුගම" නිවාස ව්‍යාපෘතිය | 14 |
| | අඟුලාන "සයුරුපුර" මහල් නිවාස ව්‍යාපෘතිය | 28 |
| | හලාවත "නරියගොඩැල්ල" නිවාස ව්‍යාපෘතිය | (අතිරේක වාරික සින්න ) 01 |
| | ලුනාව සී විව් රෙසිඩන්සීස් මහල් නිවාස ව්‍යාපෘතිය | 37 |
| **එකතුව** | | **86** |

## නෛතික ක්‍රියාමාර්ග ගැනීම

තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති කිරීම සඳහා අධිකරණ කටයුතු හා නොතාරිස් කටයුතු යන අංශ දෙක හරහා නීතිමය දායකත්වය සක්‍රීයව ලබාදීම සිදුකරයි. අධිකාරිය විසින් ලබාදී ඇති නිවාස ණය නැවත ගෙවීම් සිදුනොකරන , නිවාස සඳහා වූ ගෙවීම් සිදුනොකරන හා එම නිවාස තෙවන පාර්ශවයක් වෙත ලබාදී ඇති ප්‍රතිලාභීන් සඳහා අධිකාරිය විසින් 2023 වර්ෂයේදී නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලදි.

| # | විෂය | ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව | 2023 වර්ෂය තුළ අවසන් වී ඇති නඩු සංඛ්‍යාව | 2023 වර්ෂය තුළ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | නෙරපීම් ආඥා නියත කර ඇති සංඛ්‍යාව | සන්තකය ආපසු පවරාගැනීම යටතේ පවරා ඇති නඩු |
|---|---|---|---|---|---|---|---|
| | දිරිය නාගරික විසිරි නිවාස ණය ව්‍යාපෘතිය | | 07 | 04 | 05 | | |
| | මොරටුව - අඟුලාන ''සයුරුපුර'' මහල් නිවාස ව්‍යාපෘතිය | 14 | 01 | | | 05 | |
| | හලාවත "නරියගොඩැල්ල" නිවාස ව්‍යාපෘතිය | | | | | | 03 |
| | කම්කරු වන්දි / කාර්මික ආරවුල | 07 | | | | | |
| | **එකතුව** | **21** | **8** | **4** | **5** | **5** | **3** |

## ඉදිරි භෞතික ව්‍යාපෘතීන් හි පරිසරය ආරක්ෂා කර ගැනීමට හා පරිසරය වෙනුවෙන් ඍණාත්මක බලපෑමක් ඇති කරන ක්‍රියාකාරකම් අවම කිරීමට ගෙන ඇති පියවර

- විදුලිජනනයට හා ගෘහස්ථ ඒකක සඳහා උණු ජලය ලබාදීමට සූයර්ය බලශක්තිය භාවිතා කිරීම
- ව්‍යාපෘතීන් හා පොදු ප්‍ර දේශ හරිත කලාප ලෙස සංවර්ධනය කිරීම හා ඒවායේ ඉදිරි නඩත්තුව කළමනාකරණ සංස්ථාව හරහා ප්‍රතිලාභී සහභාගීත්වය ඇතිව සිදුකිරීම
- ව්‍යාපෘති භූමිය තුල රැස්වන වැසි ජලය හා ගෘහස්ථ ඒකක මඟින් මුදාහරිනු ලබන අප ජලය ගබඩා කර පිරිපහදු කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ගෙවතු වගා කටයුතු සඳහා භාවිතා කිරීම.

## අවදානම් තක්සේරු කිරීමේ හා අවම කිරීමේ උපාය මාර්ග

| | |
|---|---|
| **පුනස්ථාපන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඉලක්කගත අඩු ආදායම්ලාභී නිවාස ප්‍රතිලාභීන් පුනස්ථාපනය කිරීමේදී ඇති වන ප්‍රතිවිරෝධය** | **සමාජ සජීවිකරණ වැඩසටහන් හරහා පූර්ව දැනුවත් කිරීම් සිදු කිරීම හා නව ජීවන රටාවට හුරුවීමට අවශ්‍යය උපදේශය සැපයීම** |
| **අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ගෙවීමේ හැකියාව අවම මට්ටමේ පැවතීම හේතුවෙන් ණය අත්කර ගැනීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පැවතීම** | සමාජ සජීවිකරණ වැඩසටහන් හරහා ප්‍රතිලාභීන් ආර්ථිකමය වශයෙන් බලගැන්වීමේ කටයුතු කිරීම<br>උදා : ස්වයං රැකියා වැඩසටහන |
| **මධ්‍ය අදායම්ලාභී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැරිය හැකි මිලකට නිවාස ඉදිකර ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ලබාදීමට සුදුසු ආයෝජකයන් සොයා ගැනීමේ දුෂ්කරතාවයක් සතු වීම** | ව්‍යාපෘති සඳහා වැයවන පිරිවැයෙන් කොටසක් ආයතනය විසින් නැවත ලබාගැනීමේ පදනම මත දැරීම |
| **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවන තාක්ෂණික ගැටළු හේතුවෙන් ඒවා අත්හිටුවීමට සිදු වීම.** | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පූවර් අධ්‍යයන හා ශක්‍යතා කටයුතු සිදුකිරීම |

# සමාජ සංවර්ධන වැඩසටහන



## සමාජ සංවර්ධන වැඩසටහන 2023

නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස කේන්ද්‍ර කර ගනිමින් එහි වෙසෙන අඩු පහසුකම් නාගරික ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර, ස්වශක්තියෙන් යුතුව ඔසවා තැබීම වෙනුවෙන් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, 2011 වර්ෂයේ සිට කොළඹ නාගරික බල ප්‍රදේශයන් හි අඩු පහසුකම් සහිත ජනාවාස ප්‍රජාව කේන්ද්‍ර කරගෙන සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය.

ඒ අනුව 2021-2025 පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම තුළ මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. 2021 වර්ෂයේ සිට මෙම වැඩසටහන සමන්විත වූයේ ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වය ධනාත්මකව වර්ධනය කර ගැනීම සහ ප්‍රජා ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රධාන මැදිහත්වීම් 4 ක් මතය.

### ප්‍රජා සහභාගීත්ව වැඩසටහන

සක්‍රිය ප්‍රජා සහභාගීත්වය තුළින් ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාව සවිබල ගැන්වීම මෙයින් අර්ථ ගැන්වේ. මෙය උප වැඩසටහන් හතරක් ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබයි.

- ප්‍රජා සමිති බලගැන්වීම
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන
- පාරිසරික වැඩසටහන
- දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ වැඩසටහන

### අධ්‍යාපනික වැඩසටහන

මූලික අධ්‍යාපනය, නිපුණතා සහ වෘත්තීය පුහුණුව තුළින් යහපත් රැකියා අවස්ථා සඳහා ප්‍රවේශ වීමට සහ නාගරික අඩු පහසුකම් සහිත දරුවන්ගේ සහ තරුණයන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කරනු ලබයි. මෙම වැඩසටහන ප්‍රධාන උප වැඩසටහන් 02 ක් ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබයි.

2.1 අඛණ්ඩ පාසල් අධ්‍යාපනය සඳහා අතවශ්‍ය පාසල් උපකරණ ලබාදීම
2.2 ජපන් භාෂාව පිළිබඳ හා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

### ස්වයංරැකියා ණය වැඩසටහන

ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ගේ ආර්ථික යහපැවැත්ම නංවාලීමට කටයුතු කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කරයි. මෙහිදී,

- දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය වැඩසටහන
- අනුරාධපුර ස්වයං රැකියා ණය වැඩසටහන
- ස්වයං රැකියා ණය වැඩසටහන සඳහා සම්පත්, පුහුණු, අමු ද්‍රව්‍ය හා පිරිවැය
- ව්‍යවසායකයින් හට වෙළඳපොළ අවස්ථා සැපයීම

### ආගමික, සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන් හි ජීවත්වන බහු-ආගමික හා බහු-වාර්ගික ප්‍රජාවන් අතර සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරිම සහ ඔවුන්ගේ මානසික යහපැවැත්ම සහතික කිරිම මෙන්ම ඔවුනගේ කුසලතා ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කිරිමටත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ඉහත සෑම මැදිහත්වීමකටම අදාළ උප මැදිහත්වීම් හා ක්‍රියාකාරකම් තුළින් ඌණ පහසුකම් සහිත ප්‍රජාවගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදිම සිදුකරනු ලබයි. 2023 දී, දිවයින පුරා දිස්ත්‍රික්ක 11 ක් ආවරණය වන පරිදි නාගරික ජනාවාස 28 ක ජීවත් වන නිවාස 5593 ක සමාජ-ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරිම සහ වැඩිදියුණු කිරිම සඳහා සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම දිස්ත්‍රික්කවලට කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, රත්නපුර, නුවරඑළිය, මාතලේ, අනුරාධපුර, මොණරාගල සහ බදුල්ල ඇතුළත් වේ. බිම් මට්ටමේ ප්‍රජා සහභාගීත්ව මැදිහත්වීම් හරහා ප්‍රජා පාදක විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රජා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

## සමාජ සංවර්ධන වැඩසටහන ජනාවාසයන් තුළ ක්‍රියාත්මක කිරිම

### 01. ප්‍රජා සහභාගීත්ව වැඩසටහන

ප්‍රජා සහභාගීත්ව වැඩසටහනේ මූලික අරමුණ වන්නේ නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාවන් අතර සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ඔවුන්ගේ සමාජ තත්ත්වයන් වැඩිදියුණු කිරිම සඳහා ප්‍රජාවන්, පුද්ගලයන් සහ ප්‍රජා මූලික සංවිධාන බල ගැන්වීමට කටයුතු කිරිමයි.

ප්‍රජා මූල සංවිධාන (CBO) පිහිටුවීම සහ ශක්තිමත් කිරිම තුළින් වැඩසටහන්වල තිරසාර බව සහතික කරන බැවින් මෙය ප්‍රජා සංවර්ධනයේ තීරණාත්මක අංගයක් ලෙස හඳුන්වාදිය හැකිය. 2023 දී හඳුනාගත් ජනාවාස 12 හි ප්‍රජා මූල සංවිධාන 12ක් පිහිටුවන ලද අතර, ඒවා පවත්වාගෙන යාම සඳහා මූලික තාක්ෂණික දැනුම සහ අවශ්‍ය මගපෙන්වීම ලබාදෙනු ලැබිය.

2023 දී, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි ක්‍රියාත්මක කරන ලද ***"මතින් නිදහස් ජනාවාසයක්"*** වැඩසටහන අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසයන් හි ප්‍රජාව තුළ වර්ධනය වන මත්ද්‍රව්‍ය මධ්‍යසාර හා දුම්වැටි භාවිතය අවම කිරිම හා යොමුවීම වැළැක්වීම වෙනුවෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කරමින් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ (ADIC) සම්පත් දායකත්වය ඇතිව ළමා සමිති හා තරුණ සමිති ඒකාබද්ධ කර ගනිමින් දැනුවත් කිරිමේ සහ ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම තුළින් මත්ද්‍රව්‍ය ,මධ්‍යසාර හා දුම්වැටි භාවිතය තුළින් සිදුවන්නා වූ සමාජ, ආර්ථික හා සංස්කෘතිකමය ගැටළු අවම කිරිම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ආශ්‍රිතව ඇතිවන බෝවන ශ්වසන රෝග හඳුනා ගැනීම සහ සායන වලට යොමු කිරීම මෙම වැඩසටහන යටතේ සිදුකරනු ලබයි. 2023 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ල ''සහස්පුර'' ජනාවාසයේ දී "මධ්‍යම ළය චිකිත්සාගාරයේ" මැදිහත්වීම ලබාගනිමින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ සායනයක් පවත්වන ලදි. එහි දී දිගුකාලීන ප්‍රතිකාර සඳහා යොමුවිය යුතු රෝගීන් හඳුනාගැනිම ද සිදු කරන ලදි.

තවද සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන යටතේ නව යෞවන යෞවනියන්ගේ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් දැනුවත් කිරිමේ වැඩමුළු සහ සනීපාරක්ෂක උපකරණ කට්ටල බෙදා දීම සිදුකරන ලදි. මෙම වැඩසටහනනේ දැනුවත් කිරිමේ වැඩමුළු සඳහා අදාළ ප්‍රදේශවල සෞඛ්‍ය වෛද්‍ය

නිළධාරි කාර්යාලයේ නිළධාරින් සම්බන්ධ කරගනු ලබයි. එමෙන්ම සෑම දැනුවත් කිරීමේ වැඩමුළුවක් අවසානයේ දීම නව යෞවන යෞවනියන් සඳහා සනීපාරක්ෂක කට්ටල ලබාදීම සිදුකරනු ලබන අතර, ඒ සඳහා අනුග්‍රහකත්වය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් සිදුකරනු ලබයි.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශයේ අධීක්ෂණය යටතේ ***"සුවෙන් සිටිමු ලස්සන වෙමු" "සුවැති දියණි"*** ආදි පොත් යුගලක් මුද්‍රණය කර එම වැඩමුළු සඳහා සහභාගීවන යෞවන යෞවනියන් හට ලබාදෙනු ලබන අතර, දැත් සේදීම් කටයුතු සම්බන්ධව සහ විෂ බීජ වලින් ආරක්ෂා වීම සඳහා ක්‍රියාකාරකම් ඇතුළත් පිරික්සුම් ලයිස්තුවක් ද ඊට ඇතුළත් වේ.

ඒ අනුව, සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මාදම්පේ ජනාවාසයේ ප්‍රජා සමිතියේ සමාජිකයින් ලේ දන් දීමේ වැඩසටහනක් සිදුකළ අතර, ප්‍රජා මූල සංවිධානයේ මූල්‍යමය දායකත්වය මත රුධිර පරිත්‍යාගශීලීන් හට වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ද පරිත්‍යාග කරන ලදි.

2023 වර්ෂයේ දී දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම වෙනුවෙන් වැඩසටහන් දියත් කළ අතර, මෙහි අරමුණ වූයේ, නාගරික අඩු පහසුකම් ජනාවාසවල හඳුනාගත් ගැටළු විශ්ලේෂණය කිරීමේ දී එකී ජනාවාසයන් හි මතුව ඇති පාරිසරික ගැටළු විසදා ගැනීම සහ අවම කිරීම සඳහා සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, දේශගුණික විපර්යාස පිළිබඳව දැනුවත් කිරීම, එහි බලපෑම අවම කරගැනීම, ඒ සඳහා අනුවර්තනය වීම සඳහා නාගරික ප්‍රජාව දැන්වත් කිරීමේ වැඩමුළු සහ එහි දෙවන අදියර ලෙස දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා දායක වීමට අදාළ ප්‍රායෝගික වැඩසටහන් රාශියක් දියත් කරනු ලැබිය. එහිදී,

- රුක්රෝපණ වැඩසටහන්
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්

ක්‍රියාත්මක කරනු ලැබිය.

විශේෂයෙන්ම මෙම වැඩසටහන සඳහා පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ආයතනයේ සම්පත් දායකත්වය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. තව ද පාරිසරික වැඩසටහන් යටතේ ප්‍රජා මූල සංවිධානවල සහභාගීත්වය මත ශ්‍රමදාන වැඩසටහන් දියත් කළ අතර, ගම්පහ - අලවතුපිටිය ජනාවාසය, වත්තල - කෙරවළපිටිය ජනාවාසය, දොම්පේ - කුට්ටිවිල ජනාවාසය,මොරටුව - අඟුලාන ''සයුරුපුර" මහල් නිවාස සංකීර්ණයේ යන ස්ථානයන්හිදී සිදුකරන ලදි.

**වාර්ෂික ප්‍රගතිය**

- 2023 වර්ෂය සඳහා නව ජනාවාස 13 ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් හඳුනාගැනීම සහ නිරීක්ෂණය සිදුකරන ලදි.
- හඳුනාගත් නව ජනාවාසයන් 12 හි ප්‍රජා මූල සංවිධාන 12 ක් ස්ථාපිත කිරීම.
- මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු 10 ක් ළමුන් 390 කගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.
- මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සහ පවත්වන ලද සායන සඳහා පුද්ගලයින් 98 ක් සම්බන්ධ විය.
- මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 07 දෙනෙකු, දුම්වැටි භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 24 දෙනෙකු සහ මධ්‍යසාර භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 09 දෙනෙකු මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ *(ADIC)* උපදේශනය සඳහා යොමු කර ඇත.
- සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ නව යෞවන යෞවනියන්ගේ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩමුළු 25 ක් සිදුකරනු ලැබූ අතර කොළඹ, ගම්පහ, හම්බන්තොට, මොණරාගල, බදුල්ල, නුවරඑළිය, කුරුණෑගල, අනුරාධපුරය, රත්නපුර යන දිස්ත්‍රික්කයන් වලට අදාළ ජනාවාසයන් හි සිදුකරන ලදි.
- යොවුන් සෞඛ්‍ය වැඩසටහන් 26ක් සඳහා සහභාගි වූ නව යෞවන යෞවනියන් 2,997 සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් කට්ටල ලබාදෙන ලදි. මෙයින් වැඩසටහන් 03ක් අධිකාරියේ ව්‍යාපෘති වල යෞවන යෞවනියන් 203ක් සඳහා සිදුකරන ලදි.
- රත්නපුර මාදම්පේ ජනාවාසයේ ලේ දන්දීමේ වැඩසටහන සඳහා පරිත්‍යාගශිලීන් 113 කු සම්බන්ධ විය.
- පාරිසරික වැඩසටහන යටතේ ශ්‍රමදාන වැඩසටහන් 07 ක් සිදුකරන ලදි.
- දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ වැඩසටහන ජනාවාස 12 ක ක්‍රියාත්මක කළ අතර,ඒ සඳහා ළමා සමිති දරුදැරියන් 456 දෙනෙකු සහභාගි විය.
- වැඩසටහන් 33ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා රු.මි.ලි. 1.11ක මූල්‍ය පිරිවැයක් දරන ලදි.

## ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් සම්බන්ධ ඡායාරූප

### 1.1 ප්‍රජා සමිති බලගැන්වීම




## 1.2 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන




## 1.3 සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන




## 1.4 පාරිසරික වැඩසටහන




## 1.4:1 -දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරිමේ වැඩසටහන




## 02. අධ්‍යාපනික වැඩසටහන

නාගරික ජනාවාසයන් හි ළමා සහ තරුණ සමාජ කණ්ඩායම් ඉලක්ක කොට ගනිමින් ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා පවත්වනු ලබන මෙම වැඩසටහන මගින්,

- පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික උපකරණ කට්ටල ලබාදීම,
- ජපන් භාෂාව පිළිබඳ කුසලතා ප්‍රවර්ධනය වෙනුවෙන් වැඩසටහන් දියත් කිරීම, සිදුකරනු ලබයි.

මෙම වැඩසටහන් සඳහා ඒ වෙනුවෙන් විශේෂ දැනුම ඇති සම්පත් දායකත්වයක් උපයෝගි කර ගනිමින් සිදුකරනු ලබන අතර, ඒ තුළින් වඩා ඵලදායිතාවයකින් සහ ගුණාත්මක භාවයකින් යුක්තව මෙම වැඩසටහන සිදුකිරීම අරමුණ වේ.

වත්මන් ශ්‍රී ලංකාවේ පවතින්නා වූ ආර්ථික පසුබිම තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා එල්ල වී ඇති බලපෑම ඉතාමත් විශාල වේ. එහි දී උසුලාගත නොහැකි ජීවන බරක් දැරීමට සිදුව ඇති මෙවන් සමාජ වපසරියක් තුළ රැකියාවක් කිරීම අරමුණු කර ගනිමින් විදේශගත වීමට විශාල පිරිසකගේ අවධානය යොමු වී ඇත.

විශේෂයෙන්ම නාගරික ජනාවාසයන් හී ජීවත් වන්නා වූ අධ්‍යාපනය නිම කළ සහ අධ්‍යාපනය අතරමඟ හැර ගිය තරුණ තරුණියන් රාශියක් විරැකියාවෙන් සිටින අතර, ඔවුන් නිසි අරමුණක් නොමැතිව වටිනා කාලය නිකරුනේ ගතකරනු ලබයි. මෙම පිරිස ඒකරාශිකර ගනිමින් ජපන් භාෂාව පිළිබඳ අධ්‍යාපනය ලබාදීම තුළින් ඔවුන් මෙරට උසස් රැකියා අවස්ථා මෙන්ම විදේශ රැකියා අවස්ථා ද හිමිකර ගැනීමට අවස්ථා උදාවනු ඇත. මෙම පවුල් වල දරුවන්ට විදේශ රැකියාවන් සඳහා යොමුවීමට දැඩි අවශ්‍යතාවයක් පවතින නමුත් ඒ සඳහා සුදුසුකම් සපුරාලීමේ දී අවශ්‍ය කරන භාෂා ප්‍රවීනත්වය ලබාගැනීම සඳහා සුදුසු ආයතනයක් හා අවශ්‍ය කරන මුදල් නොමැතිවීම හේතුවෙන් ඔවුන් විදේශ රැකියා සඳහා යොමු වීමට පසුබට වේ. මෙම වැඩසටහන මගින් ජපන් භාෂා ප්‍රවීනත්වය ලබාගැනීමට අවශ්‍ය වූ තරුණ තැරුණියින් හට නිසි මඟපෙන්වීමක් සිදුකිරීම සහ ජපන් භාෂාව හැදෑරීමට ශිෂ්‍යත්වයක් ලබාදීම තුළින් ඔවුන්ගේ ජීවිත කළඑළි කිරීමට මෙම වැඩසටහන විශාල රුකුලක් වේ.

තරුණ තරුණයින්ගේ සහ දරුවන්ගේ කුසලතා, හැකියාවන් හා ආකල්ප ප්‍රවර්ධනය වෙනුවෙන් ක්‍රියාකාරි ක්ෂේත්‍රවල ළමා සමිති සහ තරුණ සමිති ස්ථාපිත කිරීම මගින් අවශ්‍ය මග පෙන්වීම, දිරිගැන්වීම් සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය කුසලතාවයන් ගොඩනැගීම මෙම වැඩසටහනේ අරමුණ විය.

සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ජනාවාසයන් හි ළමා සමිති පිහිටුවා ඒ ඔස්සේ අඛණ්ඩ අධ්‍යාපනයට සහයවීමේ වැඩසටහන යටතේ නාගරික අඩුපහසුකම් සහිත ජනාවාසයන් හි ආර්ථික

අපහසුතාවයන් සහිත පවුල්වල ඉගනුම ලබන ළමුන් වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදීමේ වැඩසටහනක් පවත්වන ලදි. මේ සඳහා හැටන් නැෂනල් බැංකුව (HNB) අනුග්‍රහකත්වය දක්වන ලදි.

වාර්ෂික ප්‍රගතිය

- මූලික අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා දරුවන්ට අත්‍යාවශ්‍ය පාසල් ද්‍රව්‍ය /ලිපි ද්‍රව්‍ය ලබා දෙන ලදී. එය කොළඹ දිස්ත්‍රික්කයේ සහස්පුර, සිංහපුර ජනාවාසයන් සඳහා 35 ක් සහ බදුල්ල දිස්ත්‍රික්කයට 149, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපුස්සැල්ලාව සඳහා 50 ක් වශයෙනි.
- ජනාවාසයේ ජීවත්වන ළමුන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීම උදෙසා ශක්තිමත් වූ ළමා සමාජ ගොඩනගමින් එම ළමා සමාජ තිරසරව පවත්වාගෙන යාම සිදුකරන ලදි. ඒ අනුව ළමා සමාජ 22 ක් ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදි .
- විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා නාගරික ජනාවාස සංවර්ධනය අධිකාරිය එක්ව ජපන් භාෂා පාඨමාලාව කොළඹ දිස්ත්‍රික්කයේ ජනාවාස මුල් කර ගනිමින් ආරම්භ කරන ලදී.(JLPT N5) එහි පළමු අදියර මාස 4 ක කාල සීමාවක් තුළ පැය 200 ක කාලයකින් ආවරණය කරන ලදි. ඒ සඳහා ළමුන් 65 දෙනෙකු සහභාගි විය.
- මෙහිදි ළමුන් 4 දෙනෙකු විභාගය(JLPT N5) සඳහා පෙනි සිටි අතර එම 4 දෙනාම විභාගය සමත් විය.
- එම ළමුන් විදේශ රැකියාවක් සඳහා අයදුම් කිරිමට අවශ්‍ය N4 පාඨමාලාවට අදාලව, සිද්ධාන්ත පන්ති මාස 3 ක් හා (සතියකට එක් දිනක්) ප්‍රයෝගික පුහුණුව මාස 4 ක් (සතියකට දින 1) වන පරිදි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ආයතනයක අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබයි.
- ප්‍රතිලාභීන් 335ක් ඉලක්ක කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා රු.මිලි. 1.85ක මූල්‍ය පිරිවැයක් දරන ලදි.

## අධ්‍යාපනික වැඩසටහන් සම්බන්ධ ඡායාරූප

**2.1:** අඛණ්ඩ පාසල් අධ්‍යාපනය සඳහා පාසල් උපකරණ ලබාදීම





**2.2:** ජපන් භාෂාව පිළිබඳව හා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන





## 03. ස්වයංරැකියා ණය වැඩසටහන

ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ප්‍රජාවගේ ආර්ථික යහපැවැත්ම නංවාලීම මෙහි අරමුණයි. ප්‍රජාව මත පදනම් වූ කුඩා පරිමාණ නිෂ්පාදන ආර්ථිකයන්, සංවර්ධනය කිරීම සහ හුදකලා වූ ආන්තික ප්‍රජාවන් අතර සැගව ඇති කුඩා පරිමාණ නිෂ්පාදන එළිදැක්වීමේ වැදගත් යාන්ත්‍රණයක් ලෙස මෙම වැඩසටහන හඳුන්වා දිය හැකිය.

කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අනාගත ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනා ගනිමින් නාගරික ජනාවාසයන්වල ස්වයංරැකියාවන් හි නිරත සහ නව ස්වයංරැකියාවක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින පුද්ගලයින්ට අවශ්‍ය තාක්ෂණික දැනුම, මූල්‍ය සහය සහ මගපෙන්වීම ලබා දෙමින් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට, දිරිගැන්වීමට සහ ප්‍රවර්ධනය කිරීමට උපකාර වන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සිදුකරන ලදී.

2023 වර්ෂයේ දී නාගරික ජනාවාසයන් හි පුහුණු වැඩමුළු 31 ක් සිදුකළ අතර, ඒ සඳහා පුද්ගලයින් 447 ප්‍රමාණයක් සම්බන්ධ වන ලදී. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර පුළුල් කිරීමට කැමති ව්‍යවසායකයින් සඳහා කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සහනදායි අඩු පොලී අනුපාත සහිත ණය යෝජනා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. එම ප්‍රජාවට ස්වයං-උත්පාදන රැකියාවක් ආරම්භ කිරීම සඳහා කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා පුහුණු වැඩසටහන් හරහා අවශ්‍ය මග පෙන්වීම ලබා දෙන ලදී.

විද්‍යාතා ආයතනය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය, කුඩා ව්‍යපාර සංවර්ධන ආයතනය ආදී රාජ්‍ය ආයතන මේ සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය ලබාදෙන ලදී. 2023 වර්ෂයේ දී, කුඩා ව්‍යාපාරිකයින්ට තම නිෂ්පාදන පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට හඳුන්වා දීමට සහ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට වෙළඳපල හඳුන්වාදීම සහ සංවිධානය කිරීම මගින් එවැනි කුඩා ව්‍යාපාරිකයින්ට සහාය වීමට අප අධිකාරියේ මැදිහත් වීම ලබාදෙනු ලබයි. ඒ අනුව 2023 නොවැම්බර් මස 29 සහ 30 දෙදින සෙත්සිරිපාය පරිශ්‍රය තුළ ***"තිරසාර සංවර්ධනයක් සඳහා ව්‍යවසායකත්ව අත්වැල වෙළඳ ප්‍රදර්ශනය"*** සිදුකළ අතර, ඒ සඳහා අප අධිකාරියේ මූල්‍යමය ණය ලබාගත් ව්‍යවසායකයින් මෙන්ම ආයතනය ඔස්සේ පැවති ස්වයංරැකියා පුහුණු වැඩමුළු සඳහා සහභාගී වූ ව්‍යවසායකයින්ගේ සංකලනයකින් යුක්තව මෙම වෙළඳ ප්‍රදර්ශනය සිදුකරන ලදී. එහි දි නිෂ්පාදන සහ ආහාර යන අංශ දෙකෙන්ම ව්‍යවසායකයින් සම්බන්ධ වූ අතරම ඔවුන් දිරිගැන්වීම වෙනුවෙන් අනුග්‍රාහක භවතුන්ගේ මැදිහත්වීම ලබාගනිමින් ත්‍යාග ලබාදීම සිදුකළේය. එමෙන්ම ඉහත අංශය දෙක ඔස්සේ පරිසර හිතකාමී සහ දේශිය නිෂ්පාදනයන් ඉදිරිපත් කළ ජයග්‍රහකයි හට සහතික පත්‍ර, කුසලාන සහ ත්‍යාග පිරිනැමීම සිදුකරන ලදී.

**වාර්ෂික ප්‍රගතිය**

- 517 දෙනෙකු සඳහා ස්වයංරැකියා වැඩසටහන පිළිබඳ මූලික දැනුවත් කිරීම් සිදුකිරීම
- ව්‍යවසායකයින් 447 දෙනෙකු සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදි
    - පහන්තිර නිෂ්පාදනය,පන් ආශ්‍රිත වැඩමුළු,මැහුම් වැඩමුළු,කෙටි කෑම නිෂ්පාදනය,බයිට් වගර් නිෂ්පාදනය,පළතුරු බීම නිෂ්පාදනය පිළිබඳ වැඩමුළු සහ බිම්මල් නිෂ්පාදය
- ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ව්‍යවසායකයින් 46 දෙනෙකු සඳහා ණය ලබා දීම සිදුකර ඇත. එයින් අඟුලාන ව්‍යාපෘතියෙන් 05ක් හා අනුරාධපුර ව්‍යාපෘතියෙන් 10දෙනෙකු වශයෙන් වේ.
- ව්‍යවසායකයින් 02 දෙනෙකුට මහන මැෂින් ගෙවීමේ පදනම මත ලබාදෙන ලදි
- කුඩා පරිමාණ ව්‍යාපාර 08 ක් ප්‍රාදේශිය ලේකම් කායර්ාලයන් හි ලියාපදිංචියට යොමු කරන ලදි
- ස්වයංරැකියාලාභින් දිරිගැන්වීම සහ වෙළඳපොළ අවස්ථා හඳුන්වාදීමේ අරමුණ ඇතිව වෂර් අවසාන වෙළඳ ප්‍රදශර්නය 2023 නොවැම්බර් මස 29 සහ 30 දෙදින සෙත්සිරිපාය පරිශ්‍රය තුළ කුඩා ව්‍යාසායකයින් 45 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදි
- පුහුණු වැඩමුළු වලින් අනතුරුව සාථර්කව ව්‍යාපාර සිදුකරනු ලබන ව්‍යවසායකයින් ගණන 67කි

| අ/අ | පුහුණු වැඩසටහන | අදාළ ජනාවාස | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | පහන්තිර නිෂ්පාදනය | අඟුලාන ''සයුරුපුර'' , අනුරාධපුර ''තුරුඉතුරුගම'' ,දිවුලපිටිය- මැදිකැලේවත්ත , මාතර -බතීගම, අත්තනගල්ල- දෙමටලන්ද | 45 |
| 2. | සිසිල්බීම /පළතුරුබීම | කතරගම - ගෝතමීගම | 01 |
| 3. | විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | අනුරාධපුර - ''තුරුඉතුරුගම'' | 02 |
| 4. | කාන්තා ආභරණ | කතරගම - ගොතමීගම | 05 |
| 5. | සබන් නිෂ්පාදන | අත්තනගල්ල -තිහාරිය, මිනුවන්ගොඩ -කොරස, මාතලේ - හිග්ගොල්ල, කැළණිය-යබරළුව , මාතර - බතීගම, මාතර - හාමුගෙවත්ත, තංගල්ල - මුස්ලිම්වීදිය, කඩුවෙල - බොරළුගොඩ, මහර - කිරිකිත්ත | 11 |
| 6. | බයිට් නිෂ්පාදන | ගනේමුල්ල , අනුරාධපුර ''තුරුඉතුරුගම'' | 02 |
| 7. | බිම්මල් නිෂ්පාදන, බිම්මල් ආශ්‍රිත සොසේජස් | මහර - කිරිකිත්ත, මීරිගම - කළුකන්ද | 02 |
| 8. | මැටි ආශ්‍රිත නිෂ්පාදන | මිනුවන්ගොඩ- සමෘද්ධිගම | 01 |
| 9. | ඇඳුම් මැසීම | කුරුණෑගල- විල්ගොඩ, අනුරාධපුර ''තුරුඉතුරුගම'' , මාතර -බතීගම | 08 |
| 10. | පන් ආශ්‍රිත නිෂ්පාදන | අනුරාධපුර ''තුරුඉතුරුගම'' | 03 |

- ප්‍රතිලාභීන් 140ක් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් 01ක ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා රු.මිලි. 2.30ක මූල්‍ය පිරිවැයක් දරන ලදි.

## ස්වයංරැකියා ණය වැඩසටහන සම්බන්ධ ඡායාරූප

### 3.1 දීප ව්‍යාප්ත ස්වයංරැකියා ණය වැඩසටහන





## 3.2 අනුරාධපුර ස්වයංරැකියා ණය වැඩසටහන



## 3.3 ස්වයං රැකියා ණය වැඩසටහන සඳහා සම්පත්, පුහුණු, අමු ද්‍රව්‍ය සහ පිරිවැය



## 3.4 ව්‍යවසායකයින් හට වෙළඳපොළ අවස්ථා සැපයිම



## 04. ආගමික , සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස කේන්ද්‍ර කරගෙන එහි වෙසෙන අඩු පහසුකම් සහිත නාගරික ප්‍රජාවගේ සහ ළමුන්ගේ ආතති කළමනාකරණය, ආකල්ප සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරිම මෙන්ම ධනාත්මක චින්තන වැඩසටහන් සිදුකිරිම තුළින් ඉලක්කගත ප්‍රජාවගේ අභිප්‍රේරණ කුසලතාවයන් සංවර්ධනය වෙනුවෙන් වැඩසටහන් දියත් කරනු ලබයි.

සමාජයේ යහපැවැත්ම සහ දරුවන්ගේ මනෝ සමාජීය සංවර්ධනය ඇති කිරිම අරමුණුකර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබන අතර, මේ සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන් හි ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරින්, ධනාත්මක චින්තන සහ අභිප්‍රේරණ සම්බන්ධ විශේෂඥ දැනුමකින් යුක්ත සම්පත්දායකයින් සම්බන්ධ කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබන අතර, 2023 වර්ෂයේ, කොළඹ, බදුල්ල, නුවරඑළිය, ගම්පහ, කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය.

තව ද අධ්‍යාපන කුසලතා සංවර්ධනය වෙනුවෙන් නිපුණතා ප්‍රවර්ධන වැඩසටහන් සහ වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ද සිදුකරනු ලැබිය. වෘත්තීය අධ්‍යාපන කුසලතා වැඩිදියුණු කිරිම වෙනුවෙන් දැනුවත් කිරිමේ වැඩමුළු සහ කාර්මික වෘත්තීමය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදීම සඳහා රත්මලාන කාර්මික විද්‍යාලයේ ක්ෂේත්‍ර නිරික්ෂණ චාරිකා දියත් කිරිම සහ යොමු කරලිමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදෙන ලදි. අධ්‍යාපනික කුසලතා ප්‍රවර්ධනය වෙනුවෙන් අඟුලාන සයුරුපුර ජනාවාසයේ දරුවන් සඳහා ***"පවුරු බිඳලමු අකුරු සිරකළ"*** තේමාව යටතේ උපකාරක පංති පැවැත්වීම මේවන විටත් සිදුකරමින් පවති.

එමෙන්ම 2023 ශිෂ්‍යත්ව කඩඉමට මුහුණ දුන් දරුවන් සඳහා ශිෂ්‍යත්ව පෙර පුහුණු වැඩසටහනක් කඩුවෙල නාගරික කලාපයේ බතලවත්ත, වැලිහිද සහ බොරළුගොඩ ජනාවාස ආවරණය වන පරිදි 2023.10.09 වන දින පෝරේ කණිෂ්ඨ විද්‍යාලයේ දී අධ්‍යාපනික කුසලතා සහ අභිප්‍රේරණ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් සහිත සම්පත්දායක මහත්මයකුගේ දායකත්වය මත සිදුකරනු ලැබිය.

එමෙන්ම සාමය සහ සමාජ සහජීවනය ගොඩනැගිම සඳහා ළමා,තරුණ සහ කාන්තා සහභාගිත්වය තුළින් බහු-ආගමික සහ බහු සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර විශේෂයෙන් ප්‍රජා ඉල්ලිම මත මව්පිය වන්දනා වැඩසටහන් 2023 වර්ෂයේ ගම්පහ,බදුල්ල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ අතර, ඒ තුළින් සමාජ සංකිර්ණභාවය සහ තරඟකාරි සමාජ රටාව සමඟ දුරස් වී ඇති මව්-පිය දූ දරු සම්බන්ධතාවයන් ගොඩනැගීම මෙහි අරමුණ විය.

විශේෂයෙන් මව්-පිය දූ දරු සබඳතාවයන් දුරස්වීම මානව සමාජයේ ප්‍රගමනය උදෙසා දැඩි බලපෑමක් සිදුකර ඇති අතර, එවැනි තත්ත්වයන් ධනාත්මක දිශානතියක් කරා යොමු කිරිමට සහ වර්තමාන සමාජයේ ආර්ථික දේශපාලනික පරිසරය හමුවේ මෙලෙස ලිහිල්වන මාපිය දූදරු සබඳතාවය ශක්තිමත් කර ගුණයහපත්කමින් යුත් සුචරිතවත් සමාජයක් නිර්මාණය කිරිමේ අරමුණ පෙර දැරිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කල කරනු ලබයි.

**වාර්ෂික ප්‍රගතිය**

- නිර්මාණශීලිත්වය සහ සෞන්දර්යාත්මක කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා පුද්ගලයන් 491 දෙනෙකුගේ සහභාගිත්වයෙන් බහු සංස්කෘතික සහ කලා රසාස්වාද වැඩසටහන් 07 ක් පවත්වන ලදි
- ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ආගමික වැඩසටහන් 03 ක් සිදුකළ අතර ඒ සඳහා පුද්ගයන් 207ක් සහභාගිවන ලදි
- ධනාත්මක චින්තනය සහ කුලසලතා ප්‍රවර්ධනය වෙනුවෙන් අභිප්‍රේරණ වැඩසටහන් 12 ක් සිදුකළ අතර, ඒ සඳහා ප්‍රජාව සහ ළමුන් 1882 ක් සහභාගි විය
- නිපුණතා ප්‍රවර්ධනය වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් හා වෘත්තිය කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 03 දියත් කළ අතර, ඒ සඳහා දරුවන් සහ තරුණ තරුණයින් 106 සම්බන්ධ වන ලදි
- වැඩසටහන් 23ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා රු.මිලි. 1.10ක මූල්‍ය පිරිවැයක් දරන ලදි.

## ආගමික , සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන සම්බන්ධ ඡායාරූප

### 4.1 ආගමික හා සංස්කෘතික වැඩසටහන





### 4.2 කුසලතා ප්‍රවර්ධන වැඩසටහන



### වෘත්තීය ප්‍රවර්ධන වැඩසටහන නිපුණතා





### අධ්‍යාපනික නිපුණතා ප්‍රවර්ධන වැඩසටහන





## 2023 ලෝක ජනාවාස දිනය

තමා සතු නිවසක් යන්න සමස්ත මානව වර්ගයාගේම ප්‍රාර්ථනයයි. සෑම පුරවැසියකුගේම හිසට සෙවණක් සලසා ගැනීමේ හිමිකම සිහි කරමින් 1986 වර්ෂයේදී **'නිවහන මගේ අයිතිය යි '** තේමාවෙන් ඇරඹුණු ලෝක ජනාවාස දිනයෙහි 37 වෙනි සැමරුම 2023 ඔක්තෝබර් මස 02 වන දින ***"සුරක්ෂිත නාගරික ආර්ථිකයක්"*** තේමාව ඔස්සේ සමරනු ලබයි. "**නිවාස**" සංකල්පය කේන්ද්‍ර කර ගනිමින් ඇරඹුණු ලෝක ජනාවාස දින සැමරුම මෑත කාලීනව නාගරික ජනාවාස කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇත්තේ, නාගරීකරණයත් සමග පැන නැගෙන ගැටළු සඳහා විසඳුම් සෙවීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමිනි. විශේෂයෙන් අඩු පහසුකම් සහිත ජනාවාසවල දරුවන් ඇතුළු පාසල් දරුවන්ගේ නිර්මාණ හැකියාව වර්ධනය කෙරෙහි සිතුවම්, නර්තන හා කෙටි චිත්‍රපට තරගාවලියක් පවත්වනු ලැබිය.

ලෝක ජනාවාස දිනය තේමා කරගනිමින් සෑම අවුරුද්දකම පවත්වන චිත්‍ර තරගය එලෙසම 2023 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව,

6-9 වයස් කාණ්ඩය
10-14 වයස් කාණ්ඩය
15-18 වයස් කාණ්ඩය
යටතේ 2023 වර්ෂයේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ජනාවාස 22 හි ළමුන්ගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබිය. පළමු අදියරේදී ළමුන් විසින් **"දේශගුණික විපර්යාසයන්හි බලපෑම අවම කිරීම"** සිතුවමට නඟන ලදි. දෙවන අදියර සඳහා එයින් නිර්මාණාත්මක සිතුවම් 500 ක් තෝරා ගත් අතර, එය උඩුගම්පොල සෙනරත් පරණවිතාන ජාතික පාසලේදී ***"සියනෑ රූ"*** ළමා සිතුවම් තරඟාවලිය

නමින් පවත්වන ලදී. එහිදී 6-9 වයස් කාණ්ඩ සඳහා ***"අපේ පරිසරය"*** නමින්ද 10-14 සහ 15-18 වයස් කාණ්ඩ සඳහා ***"සොබා පරිසරය සුරකිමින් නාගරිකරණයට මුහුණ දෙමු"*** යන මාතෘකා ඔස්සේ සිතුවම් නිර්මාණය කරන ලදී. මෙහිදි දරුවන් ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් මේ සඳහා ඉදිරිපත් වී සිතුවම් නිර්මාණය කරනු දැකීම විශේෂත්වයක් විය.
එසේම ළමුන්ගේ නිර්මාණාත්මක කුසලතා උපයෝගි කර ගනිමින් **"දේශගුණික විපර්යාසයන්හි බලපෑම අවම කිරීම"** යන තේමාව යටතේ ජංගම දුරකථනය භාවිතය කරමින් විනාඩි 5 ක නිර්මාණශිලි කෙටි චිත්‍රපට තරඟාවලියක් දියත් කළ අතර විශේෂයෙන් එය ක්‍රියාකාරි ළමා සමාජයන් හි සමාජිකයින්ගේ සහභාගිත්වය තුළින් සිදුකරන ලදි.

මේ සඳහා කොළඹ, ගම්පහ, මාතලේ, හම්බන්තොට, මාතර, රත්නපුර, නුවරඑළිය, අනුරාධපුරය දිස්ත්‍රික්කයන්හි මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ජනාවසයන්ගෙන් කෙටි චිත්‍රපට ඉදිරිපත් විය. ළමා කෙටි චිත්‍රපට පිළිබඳ විශේෂ ප්‍රවිනත්වයක් සහිත විනිශ්චය මණ්ඩලයකගේ සහභාගිත්වය මත හොඳම නිර්මාණයන් 3ක් ජයග්‍රාහි කෙටි චිත්‍රපට ලෙස තෝරා ගැනීම සිදුකරන ලදි. මෙහිදි ජයග්‍රාහකයන් හට ත්‍යාග, සහතික හා කුසලාන පිරිනමනු ලබයි.

තවද, ලෝක ජනාවාස දින සැමරිමට සමගාමීව ළමා නර්තන තරගාවලියක්ද පවත්වනු ලැබිය. මෙහිදි එක් නර්තන කණ්ඩායමක් සඳහා ළමුන් 5- 10 ත් අතර සංඛ්‍යාවක් සහභාගි වූ අතර, ඔවුන් හට නව නිර්මාණ ඉදිරිපත් කිරිමට අවස්ථාව උදා විය. මෙම නර්තන තරගාවලිය සඳහා ළමුන් තම ජනාවාසය තුලදි ඉතා උනන්දුවෙන් පුහුණු විම් සඳහා සහභාගි වූ අතර, නර්තන තරගාවලියේදී තම නර්තනය නිර්මාණශිලිව ඉදිරිපත් කරන ලදි. ඉන් පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගත් ළමා නර්තන කණ්ඩායම් වෙත ලෝක ජනාවාස දින සැමරුම් උත්සවයේදී සහතික පත්, කුසලාන ලබා දෙන ලදි

වාර්ෂික ප්‍රගතිය

- ජනාවාස මට්ටමින් ළමා සිතුවම් 3000 කට ආසන්න ප්‍රමාණයක් පළමු වටයේ තරගය සඳහා ඉදිරිපත් විය. සුදුසුකම් ලත් විනිශ්චය මණ්ඩලයක අධීක්ෂණයෙන් වයස් කාණ්ඩ 3 යටතේ ළමා සිතුවම් 500 ක් දෙවන අදියර සඳහා තෝරා ගන්නා ලදි.
- දෙවන අදියරේදි වයස් කාණ්ඩ 3 යටතේ විශිෂ්ට කුසලතා සිතුවම් 9 ක් ද, විශේෂ කුසලතා සිතුවම් 21ක් හා කුසලතා සිතුවම් 30 ක් තෝරා ගන්නා ලදි.
- කෙටි චිත්‍රපට 18ක් තරගය සඳහා ඉදිරිපත් වූ අතර ළමුන් 150ක් රංගනයෙන් දායක විය.
- ළමා නර්ථන තරගාවලිය සඳහා කණ්ඩායම් 20 ක් සහභාගි වූ අතර, ළමුන් 120 ක් නර්තන කණ්ඩායම් සඳහා ඇතුලත් විය.

## 2023 ලෝක ජනාවාස දින ඡායාරූප

### ළමා සිතුවම් තරඟාවලිය






### ළමා නර්තන තරඟාවලිය






### කෙටි චිත්‍රපට තරඟාවලිය




## ලෝක ජනාවාස ජාතික සැමරුම් උත්සවය - 2023

2023 ඔක්තෝබර් 02 වන දින ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රදානත්වයෙන්, නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය ගරු තේනුක විදානගමගේ මැතිතුමාගේ සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනෙහි ශ්‍රී ලංකා ප්‍රධානි ලක්ෂ්මන් පෙරේරා මහතාගේ සහ අමාත්‍යාංශ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ලෝක ජනාවාස දින ජාතික සැමරුම් උත්සවය පවත්වන ලදි. මෙහිදී ළමා සිතුවම් තරගාවලියේ හා ළමා නර්තන තරගාවලියේ ජයග්‍රාහකයන් හට සහතික, කුසලාන හා ත්‍යාග මුදල් ලබා දෙන ලදි.



## ප්‍රධාන කාර්යය දර්ශක

**භෞතික සංවර්ධන ව්‍යාපෘති**

2023 වර්ෂයේ දී ප්‍රතිලාභීන් සඳහා නිවාස ඔප්පු සංඛ්‍යාව 23ක් ප්‍රදානය කිරීම

**මානව සංවර්ධන වැඩසටහන**

**01.ප්‍රජා සංවර්ධන වැඩසටහන**

1. තම මූල්‍යමය තත්ත්වය මත ඉතිරිකිරීම්වලට යොමු වූ පුද්ගලයන් ගණන

2. ජනාවාසයක ප්‍රජාවගෙන් මත්ද්‍රව්‍යවලින් මිදී ඇති පුද්ගලයන් ගණන

3. මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීම සඳහා පුනරුත්තාපනය කිරීමට හඳුනා ගත් පුද්ගලයන් ගණන

4. සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගලයන්ගෙන් බෝ නොවන රෝග හඳුනා ගන්නා ලද පුද්ගලයන් ගණන

5. දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සම්බන්ධ වීමෙන් පසුව ඊට අදාලව ජනාවාසයන් තුළ ප්‍රජාව විසින්ම ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ගණන

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 07 දෙනෙකු, දුම්වැටි භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 24 දෙනෙකු සහ මධ්‍යසාර භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් 09 දෙනෙකු මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ *(ADIC)* උපදේශනය සඳහා යොමු කර ඇත.

යොවුන් සෞඛ්‍ය වැඩසටහන් 26ක් සඳහා සහභාගි වූ නව යෞවන යෞවනියන් 2,997 සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් කට්ටල ලබාදෙන ලදි. මෙයින් වැඩසටහන් 03ක් අධිකාරියේ ව්‍යාපෘති වල යෞවන යෞවනියන් 203ක් සඳහා සිදුකරන ලදි.

**02.අධ්‍යාපන වැඩසටහන**

1. අඩු ආදායම්ලාභී ප්‍රජාව තුළ වෘත්තිය පුහුණුව අවසන් කරන ලද තරුණ පිරිස් ප්‍රමාණය

2. අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසුව දිනපතා පාසල් යාම සඳහා පෙළඹුන ළමුන් සංඛ්‍යාව

3. වෘත්තිය පුහුණුව ඔස්සේ රැකියා අවස්ථා ලද තරුණ තරුණියන් සංඛ්‍යාව

විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා නාගරික ජනාවාස සංවර්ධනය අධිකාරිය එක්ව ජපන් භාෂා පාඨමාලාව කොළඹ දිස්ත්‍රික්කයේ ජනාවාස මුල් කර ගනිමින් ආරම්භ කරන ලදී.(JLPT N5) එහි පළමු අදියර මාස 4 ක කාල සීමාවක් තුළ පැය 200 ක කාලයකින් ආවරණය කරන ලදි. ඒ සඳහා ළමුන් 65 දෙනෙකු සහභාගි විය.

මෙහිදි ළමුන් 4 දෙනෙකු විභාගය(JLPT N5) සඳහා පෙනි සිටි අතර එම 4 දෙනාම විභාගය සමත් විය.

**03.ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්**

1. වෙළඳපොල සඳහා යොමු වූ පුදගලයන් ගණන

2. ව්‍යවසායකයින් දැනුවත් කිරිමේ වැඩසටහන්වලට සහභාගී වීමෙන් අනතුරුව තව ව්‍යාපාර දියුණු කර ගත් පුද්ගලයන් සංඛ්‍යාව

3. අධිකාරිය විසින් මුල්‍යමය ආධාර ලබා ගැනීමෙන් පසුව තම ව්‍යාපාර ආරම්භ කළ හා දියුණු කර ගත් ව්‍යවසායකයන් ගණන

ව්‍යවසායකයින් 447 දෙනෙකු සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදි
පහන්තිර නිෂ්පාදනය,පන් ආශ්‍රිත වැඩමුළු,මැහුම් වැඩමුළු,කෙටි කෑම නිෂ්පාදනය,බයිට් වර්ග නිෂ්පාදනය,පළතුරු බීම නිෂ්පාදනය පිළිබඳ වැඩමුළු සහ බිම්මල් නිෂ්පාදය

ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ව්‍යවසායකයින් 46 දෙනෙකු සඳහා ණය ලබා දීම සිදුකර ඇත. එයින් අඹුලාන ව්‍යාපෘතියෙන් 05ක් හා අනුරාධපුර ව්‍යාපෘතියෙන් 10දෙනෙකු වශයෙන් වේ.

කුඩා පරිමාණ ව්‍යාපාර 08 ක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන් හි ලියාපදිංචියට යොමු කරන ලදි

ස්වයංරැකියාලාභින් දිරිගැන්විම සහ වෙළඳපොළ අවස්ථා හඳුන්වාදිමේ අරමුණ ඇතිව වර්ෂ අවසාන වෙළඳ ප්‍රදර්ශනය 2023 නොවැම්බර් මස 29 සහ 30 දෙදින සෙත්සිරිපාය පරිශ්‍රය තුළ කුඩා ව්‍යසායකයින් 45 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදි

පුහුණු වැඩමුළු වලින් අනතුරුව සාර්ථකව ව්‍යාපාර සිදුකරනු ලබන ව්‍යවසායකයින් ගණන 67කි

**04. සමාජ සංස්කෘතික ඒකාබද්ධ වැඩසටහන**

1. ප්‍රජාව විසින්ම වැඩසටහන් පවත්වනු ලැබූ ජනාවාස ගණන

2.දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීමෙන් අනතුරුව ඉරිදා දහම් පාසල් සහ අනෙකුත් ආගමික අධ්‍යාපනයන් සඳහා යොමු වූ දරුවන් සංඛ්‍යාව

නිර්මාණශිලිත්වය සහ සෞන්දර්යාත්මක කුසලතා ප්‍රවර්ධනය කිරිම සහ දිරිගැන්විම සඳහා පුද්ගලයන් 491 දෙනෙකුගේ සහභාගිත්වයෙන් බහු සංස්කෘතික සහ කලා රසාස්වාද වැඩසටහන් 07 ක් පවත්වන ලදි

ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ආගමික වැඩසටහන් 03 ක් සිදුකළ අතර ඒ සඳහා පුද්ගයන් 207ක් සහභාගිවන ලදි

ධනාත්මක චින්තනය සහ කුලසලතා ප්‍රවර්ධනය වෙනුවෙන් අභිප්‍රේරණ වැඩසටහන් 12 ක් සිදුකළ අතර, ඒ සඳහා ප්‍රජාව සහ ළමුන් 1882 ක් සහභාගි විය

නිපුණතා ප්‍රවර්ධනය වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් හා වෘත්තිය කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 03 දියත් කළ අතර, ඒ සඳහා දරුවන් සහ තරුණ තරුණයින් 106 සම්බන්ධ වන ලදි

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර ඉපයීම් (අයකිරීම්) ප්‍රගතිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ යටතේ පවතින නිම කරන ලද නිවාස ව්‍යාපෘති 10ක නිවාස හිමි ප්‍රතිලාභින්ගෙන් නිවාස හිමිකම් ලබාදීමේදී හිඟ ණය මුදල් හා නිවාස ණය වැඩසටහන් යටතේ ණය ලබාගත් ප්‍රතිලාභින්ගෙන් එම ණය වාරික වශයෙන් අයකිරීම් අප අධිකාරියෙහි අයකිරීම් අංශය මගින් සිදු කරනු ලබයි.

මෙහිදී නිවාස හිමිකරුවන් පුනස්ථාපන, පුනස්ථාපන නොවන, විකුණුම්, හා කුලී වශයෙන් නිවාස ලබාගෙන ඇත. 2023 වර්ෂය සඳහා මෙම අයකිරීම් පිලිබඳ ප්‍රගතිය 2022 වසරට සාපේක්ෂව පහත ප්‍රස්තාරයෙන් නිරූපනය වේ.




ඉහත ප්‍රස්තරයට අනුව 2023 වර්ෂයෙහි අධිකාරියේ අයකිරීම් ආදායම පෙර වසරට සාපේෂව වැඩිවිමක් පෙන්නුම් කෙරේ

## භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

2023 වර්ෂය සඳහා තුලදී රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය (PPP Model) යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වත්තල වැලිසර, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා නිට්ටඹුව ඕර්වඩ් වත්ත නිවාස ව්‍යාපෘතින්, පෞද්ගලික හා දේශීය ආයෝජකයින් රට තුළ පවතින මූල්‍ය අස්ථාවරත්වය හේතුවෙන් නව ආයෝජනයන් සඳහා යොමු විමට මැලිකමක් දැක්විම මත ආරම්භ කිරීමට නොහැකි විය.

එමෙන්ම ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්ථන වියදම් යටතේ සැලසුම් කරන ලද අනෙකුත් වැඩසටහන් හා මිලදී ගැනිම්, රටතුළ පවතින මූල්‍ය අස්ථාවරත්වය හේතුවෙන් රාජ්‍ය වියදම් පාලනය කිරිම හා සීමා කිරිම, ආනයන සීමා කිරිම හේතුවෙන් වෙළඳපල තුළ භාණ්ඩ හිඟයක් නිර්මාණය විම හා එකී හේතුව මත අධික උද්ගමනකාරි තත්ත්වයක් ඇතිවිමෙන් සැලසුම් කල ආකාරයට සියලු ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ අතර 2023/12/31 දින වන විට සිදු කරන ලද ප්‍රසම්පාදනයන්හි කාර්තුමය ප්‍රගතිය ප්‍රස්තාරය මගින් දක්වා ඇත.



## මානව සම්පත් සංවර්ධනය සහ ආයතන පරිපාලන කටයුතු

### 2022 වර්ෂය තුල ආයතනයහි සේවක කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන්

සේවක කාර්යක්ෂමතාව සහ ඵලදායිත්ව නන්වනු පිණිස පුහුණු වැඩසටහන් රාශියක් සිදුකරන ලදි. ඒවායෙහි විස්තර පහත වගුවෙහි දැක්වේ.

| අ/අ | පුහුණු වැඩසටහන | පුහුණුව ලබාදුන් ආයතනය | පුහුණුව සඳහා නිලධාරීන් නම් කල අංශ | නිලධාරීන් ගණන |
|---|---|---|---|---|
| 1 | Training Program on SLPSAS | APFASL | ප්‍රසම්පාදන / අයකිරීම් අංශය | 2 |
| 2 | සමස්ථ කාර්ය මණ්ඩලයේ අන්තර් සම්බන්ධතා සංවර්ධනය හා ප්‍රවර්ධන වැඩසටහන | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | සියළු අංශ | සියළු අංශය |
| 3 | ප්‍රවාහන කළමනාකරණය | SDFL | ඉංජිනේරු /පාලන අංශ | 2 |
| 4 | විනය කාර්ය පටිපාටිය | SDFL | සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය පාලන / නිති අංශ | 7 |
| 5 | Public Procurement Procedures | SDFL | තොරතුරු තාක්ෂණ/ ප්‍රසම්පාදන අංශ | 4 |
| 6 | occupational Health & Safety Better Environment | SDFL | ඉංජිනේරු අංශය | 4 |
| 7 | රියදුරන් සඳහා විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිතව රිය පැදවීම | CETRAC | රියදුරන් | 6 |
| 8 | Corporate Plan Development | SDFL | සැලසුම් හා අධීක්ෂණ /සමාජ සජීවීකරණ /පාලන /ඉඩම් අංශ | 8 |
| 9 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | SDFL | සැලසුම් හා අධීක්ෂණ /මුදල් /ඉංජිනේරු අංශ | 8 |
| 10 | Recent Changes to Tax Legislation | SDFL | මුදල් /ඉංජිනේරු අංශ | 4 |
| 11 | සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය ඉහල නැංවීම | SDFL | සමාජ සජීවීකරණ / ඉඩම් /පාලන /නිති අංශ | 12 |
| 12 | Performance Appraisal & KPI 'S | SDFL | පාලන /සැලසුම් හා අධීක්ෂණ අංශ | 4 |
| 13 | Seminar On Practical Approach to MEP quantification | CIDA | ඉංජිනේරු අංශය | 5 |

## අධ්‍යාපන ණය ලබාදීම

අධිකාරියේ සේවයකයන් දැනුමින් සුපෝෂණය කරමින් ඔවුන් ලබාගන්නා වූ දැනුම කාර්යාලය ක්‍රමය තුල මනාව කළමනාකරණය කිරිම උදෙසා අධ්‍යපන ණය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් 2023 වර්ෂයේ නිලධාරින් 04 දෙනෙකු සඳහා අධ්‍යපන ණය ලබාදීම සිදුකර ඇත.

| අ/අ | පුහුණු වැඩසටහන | පුහුණුව ලබාදුන් ආයතනය | පුහුණුව සඳහා නිලධාරින් නම් කල අංශ | නිලධාරින් ගණන |
|---|---|---|---|---|
| | මූල්‍යමය ගණිතය පශ්චාත් උපාධි පාඨමාලාව | මොරටුව විශ්ව විද්‍යාලය | සැලසුම් හා අධීක්ෂණ අංශය | 1 |
| | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | කැළණිය විශ්ව විද්‍යාලය | සමාජ සජීවීකරණ අංශය | 1 |
| | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | කැළණිය විශ්ව විද්‍යාලය | සමාජ සජීවීකරණ අංශය | 1 |
| | ශ්‍රම කළමනාකරණ අධ්‍යනය පිළිබඳ උපාධි පාඨමාලාව | කොළඹ විශ්ව විද්‍යාලය | ඉංජිනේරු අංශය | 1 |
| **2023 වර්ෂයේ ලබාදී ඇති මුළු අධ්‍යාපන ණය ප්‍රමාණය** | | | | 04 |

## දුක්ගැනවිලි විමසා බැලිම සඳහා වන කමිටුව ස්ථාපිත කිරිම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු සේවකයන්ගෙන් නිරන්තරයෙන් ඉදිරිපත් වන දීර්ඝකාලිනව නොවිසඳුනු විවිධ ඉල්ලීම්, ගැටළු විමසා බැලිම සඳහා පැහැදිලි ක්‍රියාවලියක අවශ්‍යතාවය පැන නැගී ඇත.

ඒ සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 02/2023/13 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සේවක දුක්ගැනවිලි විමසා බැලිමේ කමිටුවක් (Grievance Committee) ස්ථාපිත කරන ලද අතර එය කමිටු සභාපති, කමිටු ලේකම් සහ කමිටු සාමාජිකයින්ගෙන් සමන්විතය.

එසේ පිහිටුවන ලද උක්ත කමිටුව විධිමත්ව පවත්වා ගැනිම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත “සේවක ගැටළු කළමනාකරණය සඳහා වන ප්‍රතිපත්තියක්” ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 02/2023/13 දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

මෙහිදී සේවක ගැටළු වාර්තා කිරිමේ පහසුව සඳහා ගැටළු වර්ගීකරණය කිරිමටත්, සේවක ගැටළු සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් කිරිම සඳහා පොදු ආකෘතියක් පිළියෙල කිරිමටත් දුක්ගැනවිලි විමසා බැලිමේ කමිටුව විසින් තීරණය කර ඇත.

එබැවින්, ආයතනය තුළ සෑම සේවකයකු සඳහාම වඩාත් විශ්වාසදායි ක්‍රමවේදයක් තුළ ඔවුන්ගේ ඉල්ලීම් සලකා බලා අවශ්‍ය විසඳුම් ලබා ගැනිම මෙන්ම එමගින් ආයතනය තුළ වඩාත් ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම මෙහි මුඛ්‍ය අරමුණ වේ.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2023.12.31 දිනට කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර

| # | වැටුප් කාණ්ඩය | අනුමත ප්‍රමාණය | | | දැනට සිටින ප්‍රමාණය | | | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | 25/2014 චක්‍රලේඛය අනුව | කොන්ත්‍රාත් | ස්ථිර | 25/2014 චක්‍රලේඛය අනුව | කොන්ත්‍රාත් | | |
| **1** | HM2-1 | 1 | | | 1 | | **-** | | |
| **2** | HM1-1 | 4 | | | 3 | | - | 1 | |
| **3** | MM1-1 | 12 | | | 11 | | - | 1 | |
| **4** | JM1-1 | 3 | | | 2 | | - | 1 | |
| **5** | MA5-1 | 14 | | | 11 | | - | 3 | |
| **6** | MA3 | 31 | | | 29 | | - | 2 | |
| **7** | MA2-1 | 14 | 1 | | 10 | 1 | - | 4 | |
| **8** | MA1-1 | 42 | 6 | | 25 | 6 | - | 17 | |
| **9** | PL3 | 10 | | 16 | 9 | | - | 1 | |
| **10** | PL1 | 11 | 2 | | 5 | 2 | - | 6 | |
| **11** | කොන්ත්‍රාත් | - | | - | - | | 1 | | 1 |
| | | **142** | **9** | **16** | **106** | **9** | **1** | **36** | **1** |
| **යෝජිත මධ්‍යම අදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා** | | | | | | | | | |
| **12** | කොන්ත්‍රාත් | - | | 13 | - | | 2 | 11 | |
| **මුළු එකතුව** | | **142** | **9** | **29** | **106** | **9** | **3** | **47** | **1** |

2023.12.31ට ස්ථිර සේවකයින් සංඛ්‍යාව = 115

## අවසන් ගිණුම් වාර්තා

### නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

### වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම් - 2023

**ආයතනික තොරතුරු**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2008 අංක 36 දරන පනත මගින් නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2008 වසරේදී ස්ථාපිත කරන ලදී. 2010 වසරේ සිට අධිකාරිය ක්‍රියාත්මක වන අතර වත්මනෙහි එය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී. නාගරික සංවර්ධන අධිකාරිය බත්තරමුල්ල සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ 9වන මහලේ පිහිටා තිබේ. නාගරික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ලඩය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සේවකයන් 182 නෙකු අනුමත කර තිබේ.

**පොදු ප්‍රතිපත්ති**

ප්‍රවර්තන ව්‍යාපාරය

අධිකාරියේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් එය සතු බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරන අතර ප්‍රවර්තන ව්‍යාපාර සංකල්පය උපකල්පනය කරමින් එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුමකරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් පිළියෙළ කොට තිබේ.

පිළියෙළ කිරීමේ පදනම්

අන්‍යාකාරයෙන් ප්‍රකාශ කොට ඇත්තේ නම් මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමකින් සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙළ කොට තිබේ.

සංසන්දනාත්මක තොරතුරු

අන්‍යාකාරයෙන් ප්‍රකාශ කර ඇත්තේ නම් මිස, අධිකාරිය විසින් ආදේශ කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරේ භාවිතා කරනු ලැබූ ප්‍රතිපත්ති සමග සංගත වේ. වත්මන් වසරේ ඉදිරිපත් කිරීම සමග අනුකූල වන පරිදි අවශ්‍ය තන්හි දී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ නැවැත සකස් කර තිබේ.

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

"නාගරික නිවාස හිමිකාරිත්වය යටතේ අඩු ආදායම් නිවාස 50,000 ක පූර්ණ හිමිකාරිත්වය ලබා දීම සඳහා වැඩසටහන" යන 2024 අයවැය යෝජනාව අඩු ආදායම් නිවාස යෝජනා ක්‍රම කෙරෙහි බලපානු ඇත. නමුත් එහි අවස්ථානුගත තත්ත්වයන් ශේෂ පත්‍ර දිනයේ සිට පැන නැගී නොමැත.

බදුකරණය

රජයේ අරමුදල් මත ක්‍රියාත්මක වන අධිකාරිය ලාබ ඉපයීමට අපේක්ෂා නොකරන බැවින්, ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

**දේපළ, පිරියත හා උපකරණ**

වාහන, ලී බඩු සහ සවිකුරු, කාර්යාල උපකරණ සහ පරිගණක ශේෂ පත්‍රයේ සමුච්චිත ක්ෂය (ශුද්ධ වටිනාකම) අඩු කොට පිරිවැයට දක්වා ඇත. 2018.01.01 දින සිට ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වනුයේ, පහත දැක්වෙන අනුපාත යටතේ සරල රේඛීය පදනමක් මත වත්කම්වල ප්‍රයෝජනවත් කාල සීමාවේ පිරිවැය සැලකිල්ලට ගනිමින් මිලදී ගත් දිනයේ සිට ක්ෂයවීම ගණනය කිරීමයි.

ක්ෂයවීමේ අනුපාත පහත පරිදි වේ.

| කාණ්ඩය | ක්ෂය අනුපාතය |
|---|---|
| ඉඩම් | 0% |
| ගොඩනැගිලි | 5% |
| වාහන | 20% |
| කාර්යාල උපකරණ | 20% |
| ලී බඩු හා සවිකුරු | 20% |
| පරිගණක | 50% |
| අස්පෘශ්‍ය වත්කම් | 25% |

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නිවාස ව්‍යාපෘතිවලට අයත් ඉඩම්වල වටිනාකම හඳුනාගනු ලැබ දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර ඇත.

නිට්ටඹුව ඕවාර්ඩ්වත්ත ඉඩමේ තක්සේරුව දැනට සිදු කරමින් පවතින අතර එහි වටිනාකම ලැබීමෙන් පසුව එම වටිනාකම 2024 වසරේ ගිණුම්ගත කරනු ඇත.

වත්කම් තක්සේරුව
3.1 හි විස්තර කර ඇති සියලු ජංගම නොවන වත්කම් වාරිකව ප්‍රත්‍යාගණනය කිරීමට යටත් වනු ඇත. වත්මන් ආයතනික ප්‍රතිපත්තිය වනුයේ වසර පහකට වරක් ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමයි.

## 4. ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ, බොල් හා අඩමාන ලැබිය යුතු දෑ සඳහා වන ප්‍රතිපාදන අඩු කොට ඒවා උපලබ්ධි වීමට තක්සේරු කර ඇති ප්‍රමාණයන්ගෙන් ප්‍රකාශ කොට තිබේ. අඩු ආදායම් ණය වැඩසටහන්වල මුළු ලැබිය යුතු දෙයින් 10% ක අඩමාන ණය ප්‍රතිපාදනයක් සලසා තිබේ.

### සේවක විශ්‍රාම ප්‍රතිලාභ

සියලු සේවකයන්ට අදාළව, සේවයේ සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහාම මාස භාගයක (1/2) වැටුප පදනම්ව විශ්‍රාම පාරිතෝෂිකය සඳහා බැරකම ගණනය කරනු ලැබේ.
කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, එම බැරකම පැන නගිනුයේ වසර පහක (5) අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ විටදී පමණි. පාරිතෝෂික ප්‍රතිපාදනය ජංගම නොවන බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත.

### බැරකම්

ශේෂ පත්‍ර දිනට සියලු උපචිත බැරකම් ගිණුම්වල අන්තර්ගත කර ඇති අතර පවතින බවට දන්නා බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. ආධාර නියෝජිතායතනවලින් ලැබෙන අරමුදල් ආශ්‍රිත පරිත්‍යාග එය ප්‍රයෝජනයට ගන්නා තෙක් බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

### ආදායම සහ වියදම

ආදායම් හා වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.
වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී හා ප්‍රාග්ධන වත්කම් පවත්වා ගෙන යාමේ දී දරන ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වා ඇත.

ප්‍රාග්ධනගත කරන නොලද, වර්ෂය සඳහා වූ ප්‍රදානයෙන් මානව සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා දරන ලද වියදම්, ආදායම් ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වා ඇත.

**රජයේ ප්‍රදානය**

භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස හඳුනාගනු ලැබ ඇති අතර ඒ අනුව ගිණුම් ගත කර ඇත.

රජයේ ප්‍රදාන ශ්‍රී ල.රා.අ.ගි.ප්‍ර. 11 ප්‍රකාරව වාර්තා කර ඇත.

වත්කම් ආශ්‍රිතව ආධාර නියෝජිතායතනවලින් ලැබුණු ප්‍රදාන එය භාවිතයට ගන්නා තෙක් බැරකමක් ලෙස මුලින්ම හඳුනාගෙන ඇත.

**පොදු හෙළිදරව් කිරීම්**

2012 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ප්‍රදානය කළ වාහන තුනක් වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත. (භාණ්ඩාගාරය ලංකා බැංකුව සමග බඳු ගිවිසුමක් යටතේ එම වාහන මිලදී ගෙන ඇත.- NB 3032, KS 5687, PD 4645)

ලියාපදිංචි අංක 58-7130, PB-5291, KA-6073 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාහන තුන රියල් එස්ටේට් (පුද්) සමාගමෙන් පවරනු ලැබ ඇත.
ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයට අයත් KJ-3870 දරන මෝටර් රථය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් අප අධිකාරියට නිදහස් කර ඇති අතර 2022 වසරේදී එහි හිමිකාරිත්වය පවරන ලදී.

ඉදිකිරීම් සඳහා අත්තිකාරම් සවලීකරණ අත්තිකාරම් සහ ද්‍රව්‍යමය අත්තිකාරම්වලින් සමන්විත වන අතර ඒවා පසුගිය වර්ෂවල එක් එක් මෙහෙයුම් ව්‍යාපෘති සඳහා ගෙවනු ලබයි.

පහත දැක්වෙන අරමුණු / එකඟ වූ ගෙවීම් සඳහා ඉතිරිකිරීමේ ගිණුම් තැන්පතු පවත්වා ගෙන යනු ලැබේ.
ඉදිකිරීම් රඳවා ගැනීම් හා අනෙකුත් ඉතුරු කිරීම්
අන්තර්ජාල ගෙවීම් බිහිදොර පහසුකම

අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ප්‍රකාරව, ලුනාව අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට බාර දෙන ලදී.
| කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌනතාවය)-පුනරාවරථන | 202,079,753.73 | 389,954,858.19 | 840,714,741.72 | 20,042,620.12 | 65,604,450.96 | (1,734,630.48) | 1,240,564.47 | (8,946,379.90) | 238,421,920.89 | 40,600,084.81 |
| ආදායම්-හුවමාරු නොවන ගණුදෙනු මත ආදායම | 32,769,347.71 | - | - | - | - | - | - | - | - | - |
| | | | | | | | | | | |
| ප්‍රාග්ධන වියදම් | 24,260,365.46 | 25,233,111.67 | 56,095,370.60 | 17,872,164.23 | 55,321,716.61 | 29,267,921.92 | 21,084,855.69 | 37,589,634.20 | 31,077,153.73 | 50,884,683.90 |
| | | | | | | | | | | |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | **24,260,365.46** | **25,233,111.67** | **56,095,370.60** | **17,872,164.23** | **55,321,716.61** | **29,267,921.92** | **21,084,855.69** | **37,589,634.20** | **31,077,153.73** | **50,884,683.90** |
| | | | | | | | | | | |
| කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌනතාවය)-ප්‍රාග්ධන | **8,508,982.25** | **(25,233,111.67)** | **(56,095,370.60)** | **(17,872,164.23)** | **(55,321,716.61)** | **(29,267,921.92)** | **(21,084,855.69)** | **(37,589,634.20)** | **(31,077,153.73)** | **(50,884,683.90)** |
| කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌනතාවය) | **210,588,735.98** | **364,721,746.52** | **784,619,371.12** | **2,170,455.89** | **10,282,734.35** | **(31,002,552.40)** | **(19,844,291.22)** | **(46,536,014.10)** | **207,344,767.16** | **(10,284,599.09)** |

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (2014 වර්ෂයේ සිට 2023 වසර දක්වා)

| අයිතම | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | | | | | | | | | |
| ජංගම වත්කම් | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 360,581,935.99 | 60,162,796.92 | 56,179,922.48 | 48,644,361.79 | 61,045,173.97 | 27,782,099.90 | 74,251,686.45 | 74,095,000.39 | 146,767,755.40 | 81,041,114.83 |
| අත්තිකාරම් | 2,084,613.95 | 1,728,215.95 | 2,033,930.27 | 3,901,309.12 | 3,554,073.62 | 3,078,634.33 | 3,278,887.65 | 5,701,394.10 | 225,629,414.16 | 170,852,520.84 |
| ලැබිය යුතු දෑ | 909,936,176.66 | 950,782,774.63 | 667,126,594.14 | 409,476,135.18 | 384,033,262.87 | 366,907,241.08 | 311,222,236.01 | 292,990,620.99 | 276,084,443.74 | 36,317,550.10 |
| තොගය | 1,972,145.71 | 61,899,260.84 | 690,280,571.16 | 40,508,305.19 | 86,758,560.48 | 100,379,845.16 | 172,745,225.41 | 213,001,072.41 | 538,884,908.41 | 17,769,909.66 |
| **ආයෝජන** | 1,148,329,056.50 | 1,309,515,056.50 | 1,092,513,202.05 | 36,625,000.00 | 34,500,000.00 | 34,500,000.00 | 34,500,000.00 | 34,500,000.00 | 34,500,000.00 | 34,500,000.00 |
| මුළු ජංගම වත්කම් | **2,422,903,928.81** | **2,384,088,104.84** | **2,508,134,220.10** | **539,155,111.28** | **569,891,070.94** | **532,647,820.47** | **595,998,035.52** | **620,288,087.89** | **1,221,866,521.71** | **340,481,095.43** |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | | | |
| ණය තොගය | 611,160,182.69 | 593,538,239.73 | 429,042,347.01 | 452,413,775.47 | 477,785,880.86 | 481,520,577.08 | 418,578,818.72 | 420,512,572.69 | 121,965,368.76 | 124,192,218.52 |
| කෙරීගෙන යන වැඩ තොග | 22,473,939.94 | 14,754,152.70 | 13,221,994.17 | 1275884524 | 1,257,577,458.15 | 1,313,178,287.42 | 1,370,592,291.49 | 1,241,924,716.52 | 643,847,680.46 | 1,775,592,625.62 |
| දේපළ , පිරියත හා උපකරණ | 734,987,205.71 | 460,361,304.19 | 51,107,430.91 | 63,229,215.42 | 20,865,413.22 | 21,673,360.35 | 9,466,352.56 | 13,775,918.25 | 7,898,473.09 | 12,970,151.34 |
| අස්පෘශ්‍ය වත්කම් | 150,342.47 | 500,000.00 | 500,000.00 | 500,000.00 | - | - | - | - | - | - |
| මුළු ජංගම නොවන වත්කම් | **1,368,771,670.81** | **1,069,153,696.62** | **493,871,772.09** | **1,792,027,515.33** | **1,756,228,752.23** | **1,816,372,224.85** | **1,798,637,462.77** | **1,676,213,207.46** | **773,711,522.31** | **1,912,754,995.48** |
| මුළු වත්කම් | **3,791,675,599.62** | **3,453,241,801.46** | **3,002,005,992.19** | **2,331,182,626.61** | **2,326,119,823.17** | **2,349,020,045.32** | **2,394,635,498.29** | **2,296,501,295.35** | **1,995,578,044.02** | **2,253,236,090.91** |
| වගකීම් හා ස්කන්ධය | | | | | | | | | | |
| ජංගම වගකීම් | | | | | | | | | | |
| උපචිත වියදම් | 15,437,191.95 | 72,534,417.89 | 242,371,010.96 | 49,211,374.47 | 55,258,599.74 | 47,337,127.77 | 66,351,619.23 | 152,962,049.10 | 24,821,085.68 | 245,903,676.94 |
| කළමණාකරන සංස්ථා අරමුදල් | 54,565,854.45 | 39,197,354.45 | 26,381,854.45 | - | 40,000.00 | 301,000.00 | 11,823,000.00 | 11,286,000.00 | 11,105,000.00 | 7,830,000.00 |
| රඳවා ගැනීම් - ඉදිකිරීම් ව්‍යාපෘති | 1,810,762.20 | 154,124.54 | 305,822.60 | 1,344,641.65 | 1,518,071.05 | 1,299,416.89 | 1,299,416.89 | 56,025,567.90 | 51,672,834.75 | 44,179,170.33 |
| මූලික ගෙවීම් (අත්තිකාරම්) | 105,000.00 | 17,459,950.00 | 140,706,346.28 | 412,878.82 | 515,367.58 | 464,983.71 | 851,995.55 | 227,754.89 | 257,530.00 | 8,250,000.00 |
| විලම්භනය කල භාණ්ඩාගාර ප්‍රදාන -ලූනාව | - | - | 751,106,192.09 | - | - | - | - | - | - | - |
| **මුළු ජංගම වගකීම්** | **71,918,808.60** | **129,345,846.88** | **1,160,871,226.38** | **50,968,894.94** | **57,332,038.37** | **49,402,528.37** | **80,326,031.67** | **220,501,371.89** | **87,856,450.43** | **306,162,847.27** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | | | | |
| පාරිතෝෂිත සඳහා වන වෙන් කිරීම් | 29,637,547.00 | 28,186,117.50 | 25,147,323.00 | 21,332,285.50 | 20,727,086.00 | 17,887,921.00 | 16,488,828.50 | 13,403,340.50 | 9,714,817.25 | 5,738,637.50 |
| ආපදා ණය සඳහා වන වෙන් කිරීම් | | | 15,000,000.00 | 5,694,754.65 | 5,694,754.65 | 5,694,754.65 | - | - | | |
| **ජංගම නොවන වගකීම්** | **29,637,547.00** | **28,186,117.50** | **40,147,323.00** | **27,027,040.15** | **26,421,840.65** | **23,582,675.65** | **16,488,828.50** | **13,403,340.50** | **9,714,817.25** | **5,738,637.50** |
| **මුළු වගකීම්** | **101,556,355.60** | **157,531,964.38** | **1,201,018,549.38** | **77,995,935.09** | **83,753,879.02** | **72,985,204.02** | **96,814,860.17** | **233,904,712.39** | **97,571,267.68** | **311,901,484.77** |
| **ශුද්ධ වත්කම්** | **3,690,119,244.02** | **3,295,709,837.08** | **1,800,987,442.81** | **2,253,186,691.52** | **2,242,365,944.15** | **2,276,034,841.30** | **2,297,820,638.12** | **2,062,596,582.96** | **1,898,006,776.34** | **1,941,334,606.14** |
| **ස්කන්ධය හා සංචිත** | | | | | | | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 1,869,451,691.93 | 2,470,331,558.88 | 836,175,539.40 | 2,072,934,309.20 | 2,105,728,013.27 | 2,149,679,644.77 | 2,081,868,530.69 | 1,826,800,184.31 | 1,627,739,363.69 | 1,878,411,960.70 |
| සංචිත | 89,568,896.22 | 90,140,350.07 | 75,884,145.55 | 75,943,995.55 | 34,500,000.00 | 34,500,000.00 | 93,094,358.50 | 93,094,358.50 | 93,094,358.50 | 93,094,358.50 |
| ප්‍රත්‍යාගණන සංචිත | | | 6,641,977.00 | 6,641,977.00 | 12,065,000.00 | 12,065,000.00 | 12,065,000.00 | 12,065,000.00 | - | - |
| | **1,959,020,588.15** | **2,560,471,908.95** | **918,701,661.95** | **2,155,520,281.75** | **2,152,293,013.27** | **2,196,244,644.77** | **2,187,027,889.19** | **1,931,959,542.81** | **1,720,833,722.19** | **1,971,506,319.20** |
| ශේෂ ආදායම (වියදම) ඉ/ගෙ | | | | | | | | | | |
| කාලපරිච්ඡේදය සඳහා ආදායම් හා වියදම් අතිරික්තය /(ඌනතාවය) | 1,731,098,655.87 | 735,237,928.13 | 882,285,780.86 | 97,666,409.77 | 90,072,930.88 | 79,790,196.53 | 110,792,748.93 | 130,637,040.15 | 177,173,054.15 | (30,171,713.01) |
| | - | - | - | - | - | - | - | - | - | - |
| **මුළු ස්කන්ධය** | **3,690,119,244.02** | **3,295,709,837.08** | **1,800,987,442.81** | **2,253,186,691.52** | **2,242,365,944.15** | **2,276,034,841.30** | **2,297,820,638.12** | **2,062,596,582.96** | **1,898,006,776.34** | **1,941,334,606.19** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HUD/C/USDA/FA/23/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 ජුනි 14 දින

සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමේ මග පෙන්වීම යටතේ මූල්‍ය ප්‍රකාශන ව්‍යුහය විදහා දැක්වීම අනුව කාලපරිච්ඡේදය සඳහා සකස් කරන ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය යටතේ අතිරික්තය පෙන්විය යුතු වුවත් අධිකාරිය විසින් ඉකුත් වර්ෂවල ප්‍රාග්ධන හා පුනරාවර්තන අතිරික්තය හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වෙන වෙනම මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 42 වන වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පිළිපැදිය යුතු ඉදිරිපත් කිරීමේ සංගතතාවය, මාස 03 ක කාලයක් සඳහා වූ ආයෝජන, සේවක පාරිතෝෂිත වියදම සහ අඩමාන ණය වියදම යන වියදම් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

අධිකාරිය වෙත විවිධ අයුරින් ලද රු. මිලියන 784.61 වූ භාණ්ඩාගාර ප්‍රදාන ගිණුම්ගත කිරීමේදී සිදු වී තිබූ දෝෂ නිවැරදි කිරීමේදී ප්‍රමිතියේ 27 ඡේදයට අනුකූලව නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

අනුරාධපුර තුරු ඉතුරුගම නිවාස 06 ට අදාළ වටිනාකම රු.මිලියන 4.90 ක් හා ඉඩමෙහි වටිනාකම රු.මිලියන 1.03 ක් ලෙස හඳුනාගෙන තිබුණද රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලද 2022 මැයි 18 දිනැති තක්සේරු වාර්තාව අනුව එම නිවාස 06 හි වටිනාකම රු. මිලියන 6.12 ක් හා ඉඩමෙහි වටිනාකම රු. මිලියන 1.43 ක් ලෙස තක්සේරු කර තිබුණද එම වෙනස මූල්‍ය ප්‍රකාශනවල නොගැලපීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජංගම නොවන වත්කම් හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුම රු. මිලියන 1.62 කින් ඌන ගණනය වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10

ප්‍රමිතයේ අංක 28 වගන්තිය අනුව භාණ්ඩ විකිණීමෙන් වන අයභාරය හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු කොන්දේසි 05 ක් තිබෙන අතර එම කොන්දේසි සියල්ල සපුරා ඇති විට අයභාර හඳුනාගත යුතුය. ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාස විවිධ ක්‍රම යටතේ බැහැර කර තිබූ අතර ඒ එක් එක් අවස්ථාවේදි අයභාරය හඳුනාගෙන තිබූ බැවින් අධිකාරිය විසින් මෙම නිවාස බැහැර කිරීමේදී විකුණුම් අවස්ථාව හඳුනා ගැනීමට නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි.

2

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11

(i) ප්‍රමිතයේ 10 ඡේදය සහ IG 30 සහ 31 ඡේදයට පටහැනිව සාධාරණ අගය රු.මිලියන 120 ක් ලෙස තක්සේරු කර තිබූ නිට්ටඹුව ඔර්වඩ් වත්තෙහි පිරිවැය වූ රු. මිලියන 60 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. අධිකාරිය විසින් පවරා දෙන ලද කොටසෙහි සාධාරණ වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීමට හෝ අවශ්‍ය හෙළිදරව්කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 14,15,16,76 ඡේද සහ IG 18,19,20 සහ 21ඡේදවල දක්වා ඇති විධි විධානවලට අනුව හුවමාරු නොවන ගණුදෙනුවලින් අයභාර හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධිකාරිය වෙත ලැබී තිබූ මුදලින් රු.මිලියන 702.14 ක් වටිනා රාජ්‍ය ප්‍රදාන, හිමිකම් හා සංචිත යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 42 ඡේදය ප්‍රකාරව, හුවමාරු නොවන ගණුදෙනුවක් මගින් අත්පත්කර ගත් වත්කමක් මූල්වරට මැනිය යුත්තේ අත්පත් කර ගත් දින සාධාරණ වටිනාකමට වුවද, නිදහස් දීමනාවක් ලෙස සංස්ථාව වෙත ලැබුණු මොරටුව ලුනාව රජය සතු ඉඩම් 2022 වර්ෂයේදී අධිකාරිය වෙත පැවරී තිබුණද මෙම ඉඩම්වල සාධාරණ වටිනාකම ගණනය කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(iv) ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් අධිකාරිය වෙත රු.මිලියන 3 ක් ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 0.73 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් මිලට ගෙන තිබුණි. අධිකාරිය විසින් සම්පූර්ණ වටිනාකම ප්‍රමිතියට පටහැනිව ආදායම ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.මිලියන 2.28 කින් අධි ගණනය වී ජංගම වගකීම් එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.

(v) ලුනාව නිවාස ව්‍යාපෘතියට අදාළ නිවාස විකිණීමෙන් ලැබෙන ආදායමින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ප්‍රතිපාදන නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූර්ණය කළ යුතු බවට 2000 දෙසැම්බර් 02 දිනැති අංක අමප/20/1844/306/055 දරණ අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කර තිබුණද භාණ්ඩාගාරය වෙතින් ලද රු.මිලියන 1267 ක් ලබාගෙන තිබුණද ඉන් රු.මිලියන 100 ක් 2023 ජූලි 21 දින ගෙවීමට කටයුතු කර ඇති අතර ඉතිරි රු.මිලියන 1167 ක වටිනාකම ජංගම වගකීමක් ලෙස නොදක්වා හිමිකම් හා සංචිත යටතේ දක්වා තිබීම නිසා වගකීම් එම අගයෙන් ඌන ගණනය වී හිමිකම් හා සංචිත එම අගයෙන් අධි ගණනය වී තිබුණි.

(vi) ප්‍රමිතියේ 106 සහ 107 ඡේදය ප්‍රකාරව හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ගැලපුම් (alternative treatment to SLPSAS 11) අනුව කාලපරිච්ඡේදය තුළදී හුවමාරු හා හුවමාරු නොවන ගණුදෙනු වලින් ලත් අයභාරයේ වටිනාකම ප්‍රධාන පන්ති මගින් වෙන් වෙන්ව පෙන්වමින් මූල්‍ය ප්‍රකාශන වල මුහුණත හෝ සටහන්වල හෙළිදරව් කළ යුතු නමුත් අධිකාරිය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12

(i) ප්‍රමිතියේ 14 (අ) ඡේදයට අනුව අධිකාරිය විසින් මධ්‍යම සහ අඩු ආදායම් ලාභීන් සඳහා විකුණුම් පදනම මත බැහැර කර තිබූ නිවාස ව්‍යාපෘති 05 ක්, පුනස්ථාපන පදනම මත බැහැර කර තිබූ නිවාස ව්‍යාපෘති 05 ක් හා වාණිජ පදනම මත බැහැර කර තිබූ ලුනාව නිවාස ව්‍යාපෘතියට අදාළ නිවාස 24 ක් පැවරීම මූල්‍ය කල්බදු ලෙස සැලකිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණු අතර එයට අදාළ ගිණුම් ප්‍රතිපත්තියක්ද හඳුනාගෙන නොතිබුණි.

(ii) අධිකාරිය විසින් මෙම ප්‍රමිතියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී විකුණන ලද තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ නිවාස 11 කට අදාළව රු. මිලියන 3.47 ක අතිරික්තයක් හඳුනාගෙන තිබූ අතර මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම අගයෙන් අධි ගණනය වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13

ප්‍රමිතියේ 7 වන ඡේදය ප්‍රකාරව, අධිකාරිය වෙත වාණිජ අරමුණු වෙනුවෙන් ලැබී තිබූ රු. මිලියන 380 ක් ලෙස ගිණුම්ගත කර ඇති නිට්ටඹුව ඔර්වඩ් වත්ත සහ වැලිසර මිල්ලගහවත්ත ඉඩම් 2 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද ආයෝජිත දේපළ ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද අධිකාරිය විසින් රු.මිලියන 146.76 ක් වටිනා නිවාස ව්‍යාපෘති 02 ක් හා ලුනාව නිවාස ව්‍යාපෘතියට අනුබද්ධිතව ඉදිකරන ලද වාණිජ ඒකක හා සේවා ස්ථාන 05 ක් ද ආයෝජිත දේපළ ලෙස නොදක්වා ආයෝජන ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් එම අගයෙන් අධි ගණනය වී ජංගම නොවන වත්කම් ඌන ගණනය වී තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19

සමාගම විසින් ප්‍රමිතය අනුව නිර්වචිත දායකත්ව සැලසුම් පිළියෙල කිරීම, නිර්වචිත ප්‍රතිලාභ වගකීම මැනීම, පැවරු හා නොපැවරු දෙයාකාර වගකීම් ඇතුළත් කිරීම, වට්ටම් කිරීම, ආයු ගණක ඇගයීම යන කාර්යයන් සිදු කිරීමෙන් තොරව රු.මිලියන 2.9 ක සේවක පාරිතෝෂිත වියදම සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන තිබුණි. එම

4

නිසා මෙම වටිනාකම සම්බන්ධයෙන් හා එයට අදාළව හඳුනාගෙන තිබූ රු.මිලියන 29.64 ක් වූ ජංගම නොවන වගකීමෙහි නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(එ) 2023 දෙසැම්බර් 31 දින වන විට ලුනාව නිවාස ව්‍යාපෘතියේ බැහැර කරන ලද නිවාස ඒකක 171 කින් රු. මිලියන 411.05 ක් ලැබිය යුතුව තිබුණද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු. මිලියන 411.7 ක් වීම හේතුවෙන් ඒ අතර රු. මිලියන 0.66 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) 2023 දෙසැම්බර් මස 31 වන දිනට අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ගිණුම් 16 ක ශේෂයන් හා විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛන අතර රු.මිලියන 7.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) නිවාස ණය අයකිරීමේදී ණයගැතියන් විසින් ඉදිරියට ගෙවූ රු.මිලියන 1.81 ක මුදලක් ලැබිය යුතු ශේෂයන්ගෙන් අඩුකර දක්වා තිබීම නිසා ලැබිය යුතු ගිණුම රු. රු.මිලියන 1.81 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) අධිකාරියෙහි 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.මිලියන 702.6 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා තිබූ නමුත් එතුළ හඳුනාගෙන තිබූ රු.මිලියන 23.4 ක අඩමාන ණය ප්‍රතිපාදනය අඩුකර ශුද්ධ අගය පමණක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ක) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් අධිකාරිය වෙත ලැබී තිබූ 2022 මැයි 18 දිනැති තක්සේරු වාර්තාව අනුව අනුරාධපුර තුරුඉතුරුගම ඉඩම් කොටස් 102 හි 2021 වර්ෂයට අදාළ තක්සේරු වටිනාකම රු. මිලියන 23.66 ක් වුවද අධිකාරිය විසින් එම වටිනාකම ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් අධිකාරියෙහි ජංගම නොවන වත්කම් හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුම රු. මිලියන 4.89 කින් ඌනගණනය වී තිබුණි.

(ග) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 1.93 බැගින් දෙවරක් විසිරි ණය ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු විසිරි ණයගැති ගිණුමට ගැලපුම් කර තිබීම හේතුවෙන් වී විසිරි ණය තොග ගිණුම (ජංගම නොවන වත්කම්) රු. මිලියන 1.93 කින් ඌනගණනය වී තිබූ අතර ඒ මත අයකරන ණය පොලී ආදායමද රු. මිලියන 0.17 කින් අධිගණනය වී තිබුණි. මේ හේතුවෙන් විසිරි ණයගැති ශේෂය (ජංගම වත්කම්) රු. මිලියන 2.11 කින් අධිගණනය වී තිබුණි.

(ච) අධිකාරියෙහි මුළු ස්ථාවර තැන්පතු වලින් සියයට 65 ක ප්‍රමාණයක් නියෝජනය කරන ස්ථාවර තැන්පතු 26 ක නියැදි පරීක්ෂණයට අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. මිලියන 176.62 ක් වුවද අධිකාරිය විසින් එම

ස්ථාවර තැන්පතු සඳහා වූ පොලිය රඳවාගත් බදු වියදම අඩුකර රු. මිලියන 174.89 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු මත ගෙවිය යුතු වූ රඳවා ගත් බදු රු.මිලියන 1.73 ක් ගිණුමේ පෙන්වා නොතිබුණි.

(ජ) ලුනාව නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 14.03 ක් අධිකාරිය විසින් වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් මෙම වටිනාකමින් ඌන ගණනය වී තිබුණි.

(ට) අධිකාරියෙහි එක් එක් නිවාස ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් වෙනුවෙන් වෙන වෙනම ණයගැති ගිණුම්, ණය අය කිරීමේ අංශය විසින් පවත්වාගෙන යන අතර ගිණුම් අංශය මගින් ණය ගැතියන් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යා යුතු වුවත් එසේ පවත්වාගෙන ගොස් නොතිබීම නිසා ණය අය කිරීමේ අංශයේ ණයගැති ශේෂයන් හා ගිණුම් අංශයේ ණයගැති ගිණුම් ශේෂ අතර රු මිලියන 7.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

6

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

8

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) (i), (ඇ), (ඉ) i, iii, (ඊ) i, (ත) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති / විධානයන්ට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 1.3 ඡේදය | ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව 2021 අගෝස්තු මස 18 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 05/2021/03 මඟින් කාර්ය මණ්ඩලය ශ්‍රේණි කිරීමේ ක්‍රමවේදයට අනුමැතිය ලබා දී තිබූ අතර ඒ මත කාර්ය මණ්ඩලය සඳහා වැටුප් වර්ධක සහ උසස් වීම් 2021 සැප්තැම්බර් මස සිට ලබාදී තිබුණ අතර මෙම ශ්‍රේණි කිරීම නිසා පෙර පැවති වැටුපට වඩා ආසන්න වශයෙන් රු.මිලියන 9.9 ක් 2023 දෙසැම්බර් මස වන විට අධිකාරියට දැරීමට සිදුවී තිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේ රු. මිලියන 958 ක් හා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 541 ක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2022 අගෝස්තු 08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 4/2022 හි 2.5 වගන්තිය | සේවකයන් සඳහා නව දීමනා හඳුන්වා නොදිය යුතු බවටත් පවතින දීමනාවල වැඩි කිරීමක් සිදු නොකළ යුතු බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු බවට උපදෙස් ලබාදී තිබුණද ඊට පටහැනිව අධිකාරිය විසින් විධායක ශ්‍රේණියේ නිලධාරීන් හට හා MM – 1 වැටුප් ශ්‍රේණියේ නිලධාරීන්හට පිළිවෙලින් රු.15,000 ක් හා රු. 5000 බැගින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 8 ක් හා ඉකුත් වර්ෂයේදී විධායක ශ්‍රේණියේ නිලධාරීන් හට පමණක් රු. මිලියන 0.76 ක ගමන් වියදම් දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

| බලතල, කර්තවය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 15 ක් ගතවුවද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරිමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. |
| (ආ) 10 වන වගන්තිය | අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) 16 (1) (ඉ) උප වගන්තිය | අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය |

10

| | | |
|---|---|---|
| | | අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. සේවා ගාස්තු අයකිරීම නවතන අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබූ රු. මිලියන 207.33 ක සේවා ගාස්තු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමට අපොහොසත්ව තිබුණි. |
| (ඇ) | 16 (3) උප වගන්තිය | අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 15 ක් ගතවී තිබුනද අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඏ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

දිළිඳු ජනතාව වෙනුවෙන් ඉදිකිරීමට යෝජිත වූ නමුත් පසුව මධ්‍ය ආදායම්ලාභීන් වෙත විකුණුම් පදනම මත බැහැර කල මොරටුව ලුනාව නිවාස සංකීර්ණයේ බිත්තිවල ජල මුද්‍රිත තීන්ත ආලේප කිරීම අත්‍යාවශ්‍ය නොවන අංගයක් සේ සළකා මූලික වැඩ විෂයන් (BOQ) තුලට ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කර මාස 06 ක් ගතවන විට එහි බිත්තිවලින් ජලය කාන්දු වන බවට විවිධ පාර්ශවයන්ගෙන් අධිකාරිය වෙත පැමිණිලි ඉදිරිපත් වී තිබුණි. මේ වන විට දෝෂ දැනුම්දීමේ කාලය ඉක්ම ගොස් තිබූ අතර කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන තිබූ රු. මිලියන 61.58 ක් වටිනා බැංකු ඇපකරයද අවලංගු වී තිබුණි. මෙම ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් රු. මිලියන (වැට් රහිත) 41.38 ක් ලුනාව නිවාස ඒකක විකිණීමෙන් ලද මුදලින් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම කාර්ය මුල් අවස්ථාවේදී සිදුකරනු ලැබුවේ නම් ඒ සඳහා දරන ලද වියදම නිවාස ගැනුම් කරුවන්ගෙන් අයකරගතහැකිව තිබුණද, දුර්වල කළමනාකරණ තීරන නිසා එම අවස්ථාව මඟහැරී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අහුලාන මහල් නිවාස ක්‍රමයෙන් සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයන්ට මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක භුක්තිය ලබාදී තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සාධාරණ මුදලක් එම ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට නියම කර තිබුණි. ඒ අනුව තවදුරටත් නිවාස ඒකක 38 කින් රු. මිලියන 55.48 ක් ලැබිය යුතුව පැවතුණි. නීතිපතිවරයාගේ උපදෙස්වලට අනුව මුදල් නොගෙවූ පුද්ගලයින්ගේ නිදහස් දීමනා අවලංගු කිරීමට කටයුතු කර තිබූ අතර නිවාස 15 ක් බැහැර කිරීමට අධිකාරිය විසින් කටයුතු කරමින් පැවතුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ තක්සේරු වටිනාකමට සියයට 20 ක අගයක් එකතු කර විකුණුම් මිල තීරණය කර නිවාස ඒකක බැහැර කළ යුතු වුවද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර අධිකාරියේ නිලධාරීන් 24 දෙනෙකු සඳහා නිවාස ලබාදීම හේතුවෙන් රජයට රු. මිලියන 20.68 ක මුදලක් අහිමි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ කාර්ය මණ්ඩලයට විකුණන ලද නිවාස ඒකක වලින් රු. මිලියන 95.34 ක් අධිකාරියට ලැබිය යුතුව තිබුණි.

(ඇ) අධිකාරිය සතුව පැවති රියල් එස්ටේට් එක්ස්චේන්ජ් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් ඉදිකරනු ලැබූ රු. මිලියන 44.78 ක් වටිනා සහස්පුර වාණිජ ඒකක 67 ක් හා වටිනාකම හඳුනාගෙන නොතිබූ සේවා ඒකක 57 ක් බදු දීමෙන් අධිකාරිය වෙත බදු ආදායම් උපයාගත හැකිව තිබුණද, නිදහස් දීමනාවක් මත සභාධිපත්‍ය කළමණාකරන අධිකාරිය යටතේ ඇති කළමණාකරන සංස්ථාවට බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තීරණය කිරීම හේතුවෙන් එම බදු ආදායම අහිමි වී තිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණවලට පටහැනිව, රු. මිලියන 9.3 ක් වටිනා ලුනාව නිවාස ක්‍රමයේ නිවාස ඒකක තුනක විකුණුම් මිල ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමකින් තොරව භුක්තිය භාරදී තිබුණි.

(ඉ) නිවාස ව්‍යාපෘති ඉදිකර නිවාසලාභීන්ට භුක්තිය භාරදී අවසන් වුවත්, බොරැල්ල වදුලු සෙවන නිවාස ව්‍යාපෘතිය, ලිඳුල තලවකැලේ නිවාස ව්‍යාපෘතිය සහ අහුලාන සයුරුපුර නිවාස සංකීර්ණය පිහිටි ඉඩම්වල හිමිකම අධිකාරිය වෙත පවරාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකිවී තිබුණි.

(ඊ) සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමේදී සිදුව තිබූ මූල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබාදුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු කටයුතු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) යටතේ

12

අදාළ රේඛිය අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඒ සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතුව ඇති බව සඳහන් වුවද රේඛිය අමාත්‍යාංශය ඒ පිළිබඳ ඉදිරි කටයුතු 2024 අප්‍රේල් වන විටත් සිදුකර නොතිබුණි.

(උ) අනුරාධපුර සුධාරක තාක්ෂණය යටතේ රු. මිලියන 4.9 ක් වැය කර ඉදි කළ නිවාස 06 මිනිස් වාසයට නුසුදුසු බව ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) විසින් සඳහන් කර තිබු අතර එම කරුණ අධිකාරියේ ඉංජිනේරුවරයෙකු විසින්ද සහතික කර තිබුණි. මෙම නිවාස ඉදිකළ නමුත් කිසිදු නඩත්තු කටයුත්තක් සිදුකර නොතිබු අතර 2013 සිට 2024 අප්‍රේල් මස වන තෙක් වසර 11 ක් පුරා නිෂ්කාර්යව පැවතුණි. කෙසේ නමුත් 2018 වර්ෂයේ සිට මුරකරුවකු බඳවා ගෙන තිබූ අතර ඔහුගේ වැටුප් හා අනෙකුත් දීමනා සඳහා එකතුව රු. මිලියන 2.75 ක වියදමක් දරා තිබුණි.

(ඌ) හලාවත නිවාස ව්‍යාපෘතිය අදියර 01 හි යටිතල පහසුකම් සංවර්ධනය සහ භූමි අලංකරණ කටයුතු, සහස්පුර නිවාස ව්‍යාපෘතියෙහි වහලයේ ස්ලැබ්වල ජල ආරක්ෂා කිරීම හා අඟුලාන නිවාස ව්‍යාපෘතියෙහි ආරක්ෂිත වැට ඉදිකිරීම යන මෙම නිවාස ව්‍යාපෘති 03 සඳහා රු.මිලියන 22.25ක් වෙන්කර තිබුනද කිසිදු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

(එ) 2023 කාර්ය සාධන වාර්තාවට අනුව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය යටතේ ක්‍රියාත්මක වන අධිකාරියෙහි මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘති වල මූලික වැඩ යටතට අයත් වන ව්‍යාපෘති පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනා ගැනීම සඳහා 2023 දෙසැම්බර් වන විට සියයට 100 ක ප්‍රගතියක් ළඟා කර ගැනීමට අපේක්ෂා කර තිබුණද 2023 වර්ෂය අවසානයට කිසිදු භෞතික හෝ මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘති 05 ක භෞතික ප්‍රගතිය සියයට 8 සිට සියයට 26 දක්වා පරාසයක වූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 14 ට වඩා පහළ මට්ටමක පැවතුණි. මෙම ව්‍යාපෘති 5 සඳහා අධිකාරියේ අභ්‍යන්තර ඉපයීම් වලින් රු.මිලියන 127.43 ක් දැරීමට අපේක්ෂා කර තිබුණද සත්‍ය වශයෙන්ම දරා තිබුණේ රු.මිලියන 7.55 ක් පමණි.

(ඒ) අධිකාරිය විසින් පුනස්ථාපන පදනම හා විකුණුම් පදනම මත ලබාදී ඇති නිවාස වලින් සහ අනෙකුත් ණය ශේෂ වලින් ණය අයකර ගැනීම සඳහා විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇතත් අධිකාරියෙහි ණය අය කර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අධිකාරිය විසින් පුනස්ථාපන පදනම මත නිවාස ලබා දුන් නිවාස ව්‍යාපෘති 05 කට අදාළව නිවාස 363 කින් සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු මුළු ණය වාරික වටිනාකම රු.මිලියන 102.83 ක් වූ අතර ඉන් වසර 3-5 ත්

13

අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 36.32 ක් වසර 05 ඉක්ම වූ අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 39.09 ක් ද විය. එම වටිනාකම මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 35.32 ක් හා සියයට 38.01 ක් විය.

(ii) අධිකාරිය විසින් විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ව්‍යාපෘති 02 කට අදාළව නිවාස 32 කින් සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු මුළු ණය වාරික වටිනාකම රු.මිලියන 39.86 ක් වූ අතර ඉන් වසර 2 -5 අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 9.2 ක් වූ අතර වසර 5 ඉක්ම වූ අයවිය යුතුව පැවති ශේෂය රු. මිලියන 24.61 ක් විය. එම වටිනාකම් මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 23.1ක් හා සියයට 61.75 ක් විය.

(iii) ලුනාව නිවාස ඒකක බැහැර කිරීමේදී මුලික ගෙවීම ලෙස නිවසක මුළු වටිනාකමින් සියයට 25 ක් මාස 3 කින් අධිකාරියට අයකර ගැනීමටත්, ඉතිරි සියයට 75 සඳහා රාජ්‍ය බැංකුවක් සමඟ සම්බන්ධ වී වසර 25 ක් තුළ ගෙවීමේ ණය පහසුකම ප්‍රතිලාභීන් වෙත සලසා දීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වුවද 2021 අප්‍රේල් 09 වන දින ජනතා අයිතියට පත්කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට නිවාසලාභීන් 149 දෙනෙකු පමණක් සම්පූර්ණ නිවාස වටිනාකම ගෙවා තිබුණු අතර නිවාසලාභීන් 207 කින් අයවිය යුතු වටිනාකම රු.මිලියන 548.45 ක් විය.

(ඔ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2019 වර්ෂයේදී ලිපියක් මගින් අධිකාරියේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය පැරණි ආකෘතියට අනුව සකස් කරන ලද්දක් බැවින් එය නව ආකෘතිය අනුව යාවත්කාලීන කර ඇනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, 2024 මාර්තු වන විටත් එම අවශ්‍යතාව ඉටුකර නොතිබුණි.

(ඕ) 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 164 ක් හා අනුමත කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 16 ක් විය. එදිනට තථ්‍ය ස්ථිර කාර්යමණ්ඩලය 118 ක් වූ අතර කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය කිසිවෙක් නොවීය. ඒ අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ පිළිවෙලින් පුරප්පාඩු 46 ක් හා පුරප්පාඩු 16 ක් වූ අතර අතිරික්ත කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 01 ක් විය. මෙලෙස පුරප්පාඩු පැවතීම ආයතනයේ පහළ කාර්ය සාධනයට සෘජුව බලපා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

14



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
நகரக் குடியிருப்பு அபிவிருத்தி அதிகாரசபை
Urban Settlement Development Authority